කාර්යසාධන වාර්තාව
2021

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07

දුරකථන : **011 2337350**

ෆැක්ස් : **011 2337355**

විද්‍යුත් තැපෑල : **dba.gov.lk@gmail.com**

වෙබ් අඩවිය : **dba.gov.lk**

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂය අංකය - 201

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

පටුන

පිටු අංකය

1. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

01.01 හැදින්වීම 1-2
01.02 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 3
01.03 ප්‍රධාන කාර්යයන් 4
01.04 සංවිධාන සටහන 5
01.05 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/ප්‍රාදේශීය කාර්යාල 6-42

2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

02.01 2021 වසරේ ක්‍රියාත්මක ව්‍යාපෘති හා වැඩසටහන් 43
02.02 2022 දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති හා වැඩසටහන් 44

3. පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය
03.1 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය 45
03.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 46
03.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය 47
විගණකාධිපති වාර්තාව 48-54
03.4 ආදායම් එකතු කිරීමේ ප්‍රකාශය 55
03.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගීකර ගැනීමේ කාර්යසාධනය 55
03.6 මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිත යෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 56
03.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 57

4. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශකය

04.1 ආයතනයේ කාර්යසාධන දර්ශකය 58

5. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු

05.1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර අරමුණු 59
05.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 60-61

6. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

06.1 කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු 2021-12-31 62
06.2 සේවක සංඛ්‍යා කළමනාකරණ 63
06.3 කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපෑම 63
06.4 කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය 64

7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

07.1අනුකූලතා වාර්තා 65-75

01. පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

01.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වන ව්‍යවස්ථාව මඟින් සහතික කොට ඇති පරිදි බුද්ධාගම ප්‍රමුඛස්ථානයෙහි තබා ශ්‍රී සම්බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීමේ රාජ්‍ය වගකීම ක්‍රියාත්මක කිරීම ප්‍රධාන වශයෙන්ම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා සහ දැහැමි බොදු සමාජයක් පවත්වා ගෙන යාමට අදාල කාලීන ව්‍යාපෘතීන් රාශියක් ඉටු කරන අතරම, 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් වන බෞද්ධ සිද්ධස්ථාන හා දේපළ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහාම යෙදවීමට අවශ්‍ය පරිපාලන සහය ලබා දීම, විහාරස්ථාන සංවර්ධනය කිරීම, දහම් පාසල් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා දිවයිනේ සියලුම සාමණේර/උපසම්පදා භික්ෂූන් ලියාපදිංචි කර ලේඛන පවත්වා ගෙන යාම සිදු කරනු ලබයි.

සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කිරීම සඳහා එවකට පත් කරන ලද කමිටු නිර්දේශයක ප්‍රතිඵලයක් වශයෙන් 1981 ජුනි 01 දින බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. එතෙක් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, මහාභාරකාර දෙපාර්තමේන්තුව හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ආදී රාජ්‍ය දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක කරන ලද බුද්ධ ශාසනයට අදාළ කාර්යයන් ද ඇතුළත්ව සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය හා අභිවෘද්ධිය උදෙසා වූ කටයුතු රාශියක් මෙම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ විවිධ අංශ ස්ථාපිත කොට ඇති අතර, එම අංශ වෙත අදාළ කාර්යයන් පවරා ඇත. විහාර දේවාලගම් ආඥා පනතට අදාල කටයුතු දුර බැහැර සිද්ධස්ථානවාසී ස්වාමීන් වහන්සේලාට ඉටු කර ගැනීම පහසු කරනු වස් මහනුවර ප්‍රාදේශීය කාර්යාලය, කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය හා රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය ස්ථාපිත කර පවත්වා ගෙන යනු ලබයි. බුද්ධ ශාසනයේ චිරස්ථිතිය, උන්නතිය හා ප්‍රවර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන වැඩසටහන් මෙම දෙපාර්තමේන්තුව මඟින් පවත්වා ගෙන යනු ලැබේ.

දහම් පාසල් අංශය මඟින් පහත සඳහන් කටයුතු ක්‍රියාත්මක කෙරේ

- ශාසනාරක්ෂක මණ්ඩලය පවත්වා ගෙන යාම හා ක්‍රියාත්මක කිරීම.
- දහම් පාසල් කටයුතු
- දහම් පාසල් පොත් මුද්‍රණය කර බෙදා හැරීම.
- දිවයින පුරා දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම.
- දහම් පාසල් සිසු කුසලතා ඇගයීමේ වැඩසටහන් ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා සමස්ත ලංකා මට්ටමින් පැවැත්වීම.
- දහම් පාසල් ගුරුවරුන්ගේ අධ්‍යාපන තත්වය නගා සිටුවීම සඳහා දහම් ගුරු සහතික පත්‍ර විභාගය පැවැත්වීම.
- දහම් පාසල් ගුරුවරුන් සඳහා නිලඇදුම් ලබා දීම.
- දහම් පාසල් ගුරුවරුන් සඳහා පුස්තකාල දීමනා ලබා දීම.
- දහම් පාසල් ගුරුවරුන් සඳහා හැඳුනුම්පත් සකස් කිරීම.
- දහම් පාසල් ගුරුවරුන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම.
- දහම් පාසල් ගොඩනැගිලි සඳහා අධාර ලබා දීම.

- දුෂ්කර දහම් පාසල් සඳහා උපකරණ ලබා දීම.
- අඛණ්ඩව දීර්ඝ කාලයක් සේවයේ යෙදී ඇති දහම් පාසල් ගුරු භවතුන්ගේ සේවාව අගය කර සහතික පත් ප්‍රදානය කිරීම.
- දහම් පාසල් ගුරුවරුන්ගේ පාලි භාෂා දැනුම වර්ධනය කිරීම සඳහා පාලි භාෂා ප්‍රවර්ධන පන්ති පවත්වා විභාගය පැවැත්වීම.
- අඩු අධ්‍යාපන මට්ටමක් සහිත දහම් පාසල් ගුරුවරුන්ට උසස් දහම් අධ්‍යාපනයක් ලබා දීම සඳහා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමඟත්, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සමඟත් ඒකාබද්ධව දහම් සරසවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

එසේම පාලන අංශය මගින් ආයතනයේ අරමුණු සඵල කර ගැනීම සඳහා සම්බන්ධීකරණ කටයුතු කරමින් දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සම්බන්ධ පරිපාලන කටයුතු ,ආයතන කටයුතු ,ගොඩනැගිලි නඩත්තුව, තැපෑල සම්බන්ධ රාජකාරි හා වාහන සම්බන්ධ රාජකාරි ඉටුකිරීම ආදිය සිදුකෙරේ.

ආයතනයේ වියහියදම් හි පාලනය කරමින් වැය ශීර්ෂය වෙත ලබා දෙන මුදල් අදාල කාර්යයන් සඳහා වියදම් කිරීම, ඒ සම්බන්ධ ගණුන් පෙන්වීම, වැටුප් ගෙවීම ආදී මූල්‍ය හා ගිණුම් කටයුතු ඉටුකිරීම ගිණුම් අංශය මඟින් සිදුවේ.
විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තියේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් පාලනය යටතේ පවත්නා බෞද්ධ සිද්ධස්ථාන වලට බස්නායක නිලමේවරුන් / භාරකරුවන් පත් කිරීම හා ඔවුන්ගේ පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම.බෞද්ධ සිද්ධස්ථාන වල දේපල පරිපාලනයට අවශ්‍ය සහය ලබාදීම. (මෙහිදි සිද්ධස්ථාන සන්තක ඉඩම් දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දී එම සිද්ධස්ථාන වලට ආදායම් ලබා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබා දීම, සඟ සතු නිශ්චල දේපල වල සුරක්ෂිත භාවය සඳහා කටයුතු යෙදීම, සිද්ධස්ථාන සන්තක දේපල වල ආරවුල් නිරවුල් කිරීමට මැදිහත් වීම ආදී කාර්යයන් වේ). දිවයිනේ සියළුම විහාරස්ථාන බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම හා අදාල නිකායේ මහානායක ස්වාමීන් වහන්සේ පත්කළ විහාරාධිපති තනතුරු පිළිගැනීම. භික්ෂූන් වහන්සේලාගේ සාමණේර හා උපසම්පදා සහතික ලියාපදිංචි කිරීම. බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ හැඳුනුම්පත් සකස් කිරීම, විහාරස්ථාන සතු දේපල හා බැංකු ගිණුම් වල ඇති මුදල් සම්බන්ධ කටයුතු ආදිය විහාර දේවාලගම් අංශය යටතේ සිදුකරනු ලබයි.

තවද සංවර්ධන අංශය යටතේ ශාසන චිරස්ථිතිය උදෙසා විහාරස්ථාන ආධාර, සිවුපස ආධාර, ආර්ථික දුෂ්කරතා පවතින විහාරස්ථාන සඳහා ආධාර කිරීම, ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල පිහිටුවීමට අදාල කටයුතු, ස්වාමීන් වහන්සේලාගේ ආදාහන කටයුතු සඳහා ආධාර කිරීම, නිදහස් දිනය, වෙසක් දිනය, පොසොන් දිනය සැමරීම සඳහා විවිධ කාර්යයන් ඉටු කිරීම, විහාරස්ථාන කාර්ය සාධක සමිති ලියාපදිංචි කිරීම, විහාරස්ථාන සඳහා සහන ගාස්තු මත දුරකථන, ජලය, විදුලිය, වැනි පහසුකම් ලබා දීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම, නිකාය හා නිකාය පාර්ශවයන් පිළිබඳ කටයුතු, කුල දරුවන් පැවිදි කිරීම හා උපසම්පදා කිරීම, නිකාය මූලස්ථාන සඳහා ගෙවීම් කටයුතු (රියදුරු/කම්කරු), ලේඛකාධාර යටතේ පොත් මිලදී ගැනීම් කටයුතු, දසසිල් මාතාවන් පිළිබඳ කටයුතු, ආරාම ලියාපදිංචි කිරීම, හැඳුනුම්පත් නිකුත් කිරීම, අධ්‍යාපන ආයතන සම්බන්ධ කටයුතු, රැස්වීම් පිළිබඳ කටයුතු හා සංඝමිත්තා ගුණ සැමරුම, සිල්මාතා පුහුණු ආයතන ඇති කොට පවත්වාගෙන යාම ආදී පුළුල් පරාසයක විහිදුණු කටයුතු පවතී.

ඉහත අංශගත කාර්යයන්ට අමතරව පොදුවේ වාර්ෂිකව පවත්වන ජාතික නිදහස් දින උත්සවය, රාජ්‍ය වෙසක් උත්සවය, වාර්ෂික සිසු නිපුණතා තරඟ පැවැත්වීම, සංඝමිත්තා පෙරහැර හා සංඝමිත්තා ගුණානුස්මරණ උළෙල පැවැත්වීම බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මඟින් නොකඩවා සිදු කරනු ලබන විශේෂ වැඩසටහන් ලෙස සඳහන් කල හැකිය.

01.2 දැක්ම/ මෙහෙවර/ අරමුණු

දැක්ම

" බොදු පිලිවෙත් සුරකින දැහැමි සමාජයක් "

මෙහෙවර

"සම්බුද්ධ ශාසනයේ විරස්ථිතිය, ප්‍රවර්ධනය හා කර්තව්‍යයන්
මැනවින් සංවිධානය කරලීම තුළින්, දේශීය හා විදේශීය බෞද්ධ ජනතාවගේ
ප්‍රබෝධයට හේතු වන දැහැමි ගුණගරුක සමාජයක් බිහි කර
ආදර්ශමත් බෞද්ධ සමාජයක අඛණ්ඩ පැවැත්ම සාක්ෂාත් කරලීම. "

අරමුණු

- ථෙරවාදී බුදුදහම ආරක්ෂා කිරීම හා බුද්ධ ශාසනයේ අනනුකූල පැවැත්ම සහතික කිරීම
- සාංඝික දේපළ සුරක්ෂිත කිරීම, සංවිධානය කිරීම හා ඒවා සම්බුද්ධ ශාසනයේ විරස්ථිතිය සඳහාම යෙදවීම
- බෞද්ධ සාරධර්ම අගයන ගුණගරුක නිර්මාණශීලී ජන සමාජයක් ඇති කිරීම
- අනාදිමත් කාලයක සිට බුද්ධ ශාසනය හා බැඳී පැවතෙන වත් පිළිවෙත් හා සම්ප්‍රදායන් ආරක්ෂා කොට අනාගතයට උරුම කර දීම හා කාලීන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි පවත්වා ගෙන යාම, පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම
- බෞද්ධ සාහිත්‍ය හා කලා ශිල්ප සංරක්ෂණය කිරීම, පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
- සංවිධානාත්මක හා නූතන තාක්ෂණයට අනුකූල බෞද්ධ ආර්ථිකයක් ගොඩනැඟීම සඳහා බෞද්ධ ජනතාව පෙළගැස්වීම හා මෙහෙයවීම

01.3 බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන කාර්යයන්

- 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතින් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති වගකීම් වන බෞද්ධ සිද්ධස්ථාන හා දේපළ සම්බුද්ධ ශාසනයේ විරස්ථිතිය සඳහාම යෙදවීමට අවශ්ය පරිපාලන සහය ලබා දීම හා ශාසනික නියාමන කටයුතු සිදු කිරීම
- විහාරස්ථාන සංවර්ධනය කිරීම
- බෞද්ධ දහම් පාසල් අධ්‍යාපනය පවත්වාගෙන යාම, වැඩිදියුණු කිරීම හා දහම් පාසල් සංවර්ධනය කිරීම
- දිවයිනේ සියලුම සාමණේර / උපසම්පදා භික්ෂූන් වහන්සේලා ලියාපදිංචි කර ලේඛන පවත්වාගෙන යාම
- සාමණේර / උපසම්පදා භික්ෂු පුහුණු වැඩසටහන් පවත්වාගෙන යාම
- සිල්මාතාවන් ලියාපදිංචිය, සිල්මාතා අභ්‍යාස ආයතන පවත්වා ගෙන යාම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- විහාරස්ථාන හා සිල්මාතා ආරාම ලියාපදිංචිය සිදු කිරීම
- බෞද්ධ විශ්ව කෝෂ කාර්යාලය හා සංක්ෂිප්ත ත්‍රිපිටක මණ්ඩලය පවත්වාගෙන යාම
- බොදු පිළිවෙතින් ශික්ෂණය ලද සමාජයක පැවැත්ම සහතික කිරීම් වස් සමාජ සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

සංවිධාන සටහන



01.4 සංවිධාන සටහන

01.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ /ප්‍රාදේශීය කාර්යාල

01.5.1 පාලන අංශය

දෙපාර්තමේන්තුවේ පාලන අංශය මඟින් ආයතනයේ පරිපාලනයට අදාලව ඉටු කරනු ලබන අතර ඒවා අතරින් ප්‍රධාන කාර්යයන් කිහිපයක් පහත පරිදි සඳහන් කල හැකිය.

01.5.1.1 පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ කටයුතු

- දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.
- වැටුප් වර්ධක ලබා දීම.
- නිලධාරීන්ගේ දේපල ණය ලබා දීම සඳහා නිර්දේශ ලබා දීම.
- වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි කිරීම.
- රජයේ නිලධාරීන් සම්බන්ධ රක්ෂණ කටයුතු
- පුහුණු කටයුතු

01.5.1.2 ප්‍රවාහන කටයුතු

- වාහන අලුත්වැඩියාව.
- වාහන සේවා කිරීම.
- රාජකාරි කටයුතු සඳහා වාහන යෙදවීම.
- වාහන රක්ෂණය කිරීම.
- ධාවන සටහන් පොත් පරීක්ෂා කිරීම.
- ඉන්ධන දහනය පරීක්ෂා කිරීම.
- ආදායම් බලපත්‍ර ලබා ගැනීම.
- වාහන සඳහා ඉන්ධන යෙදීම.

01.5.1.3 ආයතනික කටයුතු

- දෙපාර්තමේන්තුව සඳහා නව තනතුරු ඇති කිරීම.
- නිලධාරීන්ගේ පැමිණීම්, පිටවීම් අධීක්ෂණය කිරීම.
- නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධ රාජකාරි කටයුතු ඉටු කිරීම.
- දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම
- අතිකාල වලට අදාල වවුචර් භාර ගැනීම හා අනුමත කිරීම.
- ගමන් වියදම් වලට අදාල වවුචර් භාර ගැනීම හා අනුමත කිරීම.
- නිලධාරීන් විසින් ලබා ගන්නා විදේශ නිවාඩු සම්බන්ධ රාජකාරි කටයුතු ඉටු කිරීම.
- නිලධාරීනීන්ගට ප්‍රසූත නිවාඩු ලබා දීමට අදාල රාජකාරි කටයුතු
- සංවර්ධන නිලධාරි තනතුර සඳහා බඳවා ගන්නා ලද නිලධාරීන්ගේ පරිවාස කාලය අවසන් වීමෙන් පසු නිලධාරීන් සේවයේ ස්ථීර කිරීම
- බෞද්ධ විශ්ව කෝෂයේ උප කර්තෘ තනතුර සඳහා උසස් කිරීමේ පටිපාටියක් සකස් කිරීම
- කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම.
- පරිගණක යතුරු ලියන සම්බන්ධ රාජකාරි
- රාජකාරි කටයුතු සඳහා විදෙස් රටවලට යන නිලධාරීන්ට විදෙස්ගතව සිටි කාලයට අදාලව දීමනා ලබා දීම.

- කාර්ය මණ්ඩලය පුහුණු කිරීම් හා පාඨමාලා සඳහා යොමු කිරීම හා වැඩමුළු පැවැත්වීම.
- ජල, විදුලි, දුරකථන,පුවත්පත් බිල්පත් පියවීම සම්බන්ධ සියළුම රාජකාරි.
- තැපෑල සම්බන්ධ සියළුම රාජකාරි.
- දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ සියළුම පරිපාලන කටයුතු.
- බඳවා ගැනීම, බඳවා ගැනීම් පටිපාටි සකස් කිරීම, කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් යාවත්කාලීන කිරීම, පාර්ලිමේන්තු වාර්තා සැකසීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම ආදී සියළුම ආයතනික කටයුතු.
- නිලධාරීන්ගේ විනය සම්බන්ධ රාජකාරි කටයුතු.
- ආපදා ණය සහ දේපළ ණය අනුමත කිරීම.
- නිලධාරීන්ගේ ස්ථාන මාරු හා අනුයුක්ත කිරීම් සම්බන්ධ සියළුම කටයුතු.
- නිලධාරීන්ගේ අග්‍රහාර රක්ෂණයට අදාළ කටයුතු.
- පරිපාලනයට අදාළව වෙනත් ආයතන සමඟ ගනුදෙනු කිරීම.
- දුරකථන, පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර සහ වායු සමීකරණ යන්ත්‍ර ඇතුළු සියළුම උපකරණ නඩත්තු කිරීම, ගොඩනැඟිලි නඩත්තු සහ අලුත්වැඩියා කිරීම (මහනායක චාරිකාරාමය, මහනුවර ප්‍රාදේශීය කාර්යාලය සහ රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය, කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය ඇතුළුව).
- මාණ්ඩලික නිලධාරී, ශාඛා ප්‍රධානී රැස්වීම් පැවැත්වීම.
- දිස්ත්‍රික් බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරී කළමනාකරණ රැස්වීම් පැවැත්වීම හා ඊට අදාල කටයුතු.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා අනෙකුත් සියළුම චක්‍රලේඛ පවත්වා ගෙන යාම හා ඊට අදාළ කටයුතු මෙහෙයවීම.
- මැතිවරණ රාජකාරි සඳහා නිලධාරීන් යොමු කිරීම සම්බන්ධ කටයුතු
- රාජකාරි හැඳුනුම්පත් සකස් කිරීම.
- කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් ලබා දීම.
- යතුරු රාජකාරි පැවරීම.
- කාර්ය මණ්ඩලය ප්‍රතිසංවිධානය කිරීම

01.5.2 තොරතුරු ඒකකය

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ තොරතුරු අංශය ස්ථාපිත කරන ලද්දේ 2015 පෙබරවාරි 14 වන දින වුව ද, පසුගිය වසර 07 පුරාම තොරතුරු අංශය මඟින් දෙපාර්තමේන්තුවට ඉටු විය යුතු සේවය සිදු විය.

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ තොරතුරු අංශයෙහි ප්‍රධාන කාර්යය වන්නේ දෙපාර්තමේන්තුව සතු විවිධ තොරතුරු හා සංඛ්‍යා ලේඛන සකස් කිරීම, ඒකරාශී කිරීම, යාවත්කාලීන කිරීමයි. එම තොරතුරු නිසි පරිදි සකස් කොට රාජ්‍ය හා පුද්ගලික අංශය වෙත මුදාහැරීමත් මෙමඟින් සිදු වේ. මෙම අංශය මඟින් සිදු කරනු ලබන කාර්යයන් පහත පරිදි වේ.

01.5.2.1 තොරතුරු පද්ධතිය හා වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම

බුද්ධ ශාසන අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ අංශයේ ද සහාය ඇතිව තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කොට ඇති අතර මෙම තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතියට නිසි අයුරින් තොරතුරු ඇතුළත් කිරීම මත විහාරස්ථානය අයත් නිකාය පාර්ශ්වය, වැඩ සිටින ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව, එම ස්වාමීන් වහන්සේලා අතරින් සාමණේර හා උපසම්පදා

ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව, දහම් පාසල, පිරිවෙන, විහාරස්ථාන සතු විවිධ සමිති සමාගම්, විහාරස්ථානය මඟින් සිදුකරන විවිධ වැඩසටහන් ආදී වශයෙන් විවිධ ඒකක යටතේ සවිස්තරාත්මක තොරතුරු ලබා ගැනීමට හැකියාව ඇත. මෙම තොරතුරු නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමේ කටයුතු ද තොරතුරු අංශය මගින් සිදුකරයි.

එසේම බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම ද තොරතුරු අංශය මගින් සිදු කරයි. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ www.dba.gov.lk වෙබ් අඩවිය මගින් අදාළ තොරතුරු බා ගත කිරීමේ හැකියාව ද පවතී.

01.5.2.2 දෙපාර්තමේන්තු මුහුණුපොත යාවත්කාලීනව පවත්වා ගැනීම

දෙපාර්තමේන්කුවෙහි විවිධ පුහුණු හා වැඩසටහන් පිළිබඳ ව මහජනතාව දැනුවත් කිරීම මෙමගින් සිදුකරයි.

01.5.2.3 දෙපාර්තමේන්තුව නමින් යුටියුබ් චැනලයක් යාවත්කාලීන පවත්වා ගැනීම

දෙපාර්තමේන්කුව මගින් සංවිධානය කරනු ලබන වැඩසටහන් හා කාලීන වශයෙන් දෙපාර්කමේන්තුව සම්බන්ධයෙන් වැදගත් වන විඩියෝ මෙම චැනලය මගින් විකාශනය කරමින් මහජනතාව දැනුවත් කිරීම.

01.5.2.4 මාධ්‍ය කටයුතු

දෙපාර්තමේන්තුවේ විවිධ වැඩසටහන් සඳහා අවශ්‍ය මාධ්‍ය ප්‍රචාරය ලබාදීම, මාධ්‍ය වෙත තොරතුරු සැපයීම, මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම හා බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් තුමාගේ සුබ පැතුම් පණිවුඩ නිකුත් කිරීම ද සිදුකරනු ලබයි.

01.5.2.5 දිනපතා පුවත්පත් වාර්තා

දිනපතා පුවත්පත් වලින් අනාවරණය කරන විවිධ වාර්තා සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය කටයුතු සඳහා සහාය දීම, වාර්තා තහවුරු කරගැනීම පිණිස විවිධ පාර්ශවයන් වෙතින් වාර්තා ලබාගැනීම සිදුකරයි.

විශේෂයෙන් බුදු දහමට නිගරු කරන ආකාරයේ වාර්තා හා ඡායාරූප සම්බන්ධයෙන් කටයුතු කිරීමත්, විහාරස්ථාන හා භික්ෂූන් වහන්සේලා වෙත සිදුවන විවිධ චෝදනා, අපහාස, අපකීර්ති හා ශාසනික අර්බුදකාරී වාර්තා සම්බන්ධයෙන් අතිගරු මහානායක ස්වාමීන් වහන්සේලා දැනුවත් කිරීමත් වාර්තා සැපයීමත් සිදුකරයි.

01.5.3 විහාර දේවාලගම් අංශය

බුද්ධසාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව සුවිශේෂී කාර්යභාරයක් සිදුකරනු ලබන දෙපාර්තමේන්තුවකි. එක් අතකින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාවට අනුව බුදු දහම පෝෂණය කිරීම රජයේ මූලික වගකීමක් වන අතර එම වගකීම නිවැරදිව ඉටු කිරීම සඳහා සහාය වීම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යභාරයයි. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණ වූයේ 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනත ක්‍රියාත්මක කරමින් බුදුසසුනේත් සංඝ සමාජයේත් චිර පැවැත්ම තහවුරු කිරීමයි.

එකී පනතේ 4.1 වගන්තිය යටතේ පාලනය වන විහාරස්ථාන හා දේවාල 254ක් සහ දස දහසකට අධික අනෙකුත් විහාරස්ථාන වල පාලන කටයුතු වල රජයේ භාරකාරවරයා ලෙස බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා සතු බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සහායවීම පිණිස කොමසාරිස්වරයෙකු යටතේ විහාර දේවාලගම් අංශය පිහිටුවා ඇත.

01.5.3.1 විහාරස්ථාන ලියාපදිංචි කිරීම

විහාරස්ථාන ලියාපදිංචි කිරීමේ දී දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන විහරාස්ථාන ලියාපදිංචි කිරීමේ අයදුම්පත විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන්වහන්සේ විසින් සම්පූර්ණ කර අදාළ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු සමායෝජක/සංවර්ධන නිළධාරි විසින් විහාරස්ථානයක් ලෙස ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අයදුම්පතෙහි සංෂිප්ත වාර්තාවක් සමග ඉදිරිපත් කල යුතු අතර අදාළ ප්‍රාදේශීය ශාසනාරක්ෂක බලමණ්ඩලයේ ලේඛකාධිකාරි ස්වාමීන් වහන්සේගේ සහ ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශය ද ලබා ගෙන විහාරස්ථානය අයත් නිකායේ මහනායක ස්වාමීන් වහන්සේ වෙතින් විහාරාධිපතිත්වය තහවුරු කිරීමේ ලිපියක් සමග ඉදිරිපත් කල යුතුය.
2008.09.10 දිනට පසුව ආරම්භ කරන ලද විහාරස්ථාන සඳහා බුද්ධශාසන ,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ පූජා භූමි අංශය මගින් අනුමැතිය ලබා ගෙන ඉහත විහාරස්ථානය ලියාපදිංචි කිරීමේ අයදුම්පත සහ විහාරාධිපතිත්වය තහවුරු කිරීමේ ලිපිය සමග ඉදිරිපත් කල යුතුය.අදාළ ලේඛන ඉදිරිපත් කළ පසු බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ අත්සනින් යුතු විහාරස්ථාන ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනු ලැබේ.

01.5.3.2 විහාරාධිපති ධූර පිළිගැනීමේ කටයුතු

විහාරස්ථානයක් ලියාපදිංචි කිරීමෙන් පසු සිදු කරනු ලබන විහාරස්ථාන වෙනස් වීමක දී උදාහරණයක් වශයෙන් පෙර විහාරාධිපති ස්වාමීන්වහන්සේ අපවත් වූ විට , වෙනත් ස්වාමීන්වහන්සේ නමකට විහාරාධිපති ධූරය පැවරීමක් සිදු කර අතිපූජ්ය මහානායක ස්වීමින් වහන්සේ විසින් සිදු කරනු ලබන විහාරාධිපති පත් කිරීම් වල දී විහාරාධිපති ධූරය පිළිගත් බව දැනුම් දීම සඳහා විහාරාධිපති ලෙස පත් වූ ස්වාමීන් වහන්සේ, ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය බෞද්ධ කටයුතු කාර්යාල වලට පිටපත් සහිතව අතිපූජ්‍ය මහානායක ස්වාමීන් වහන්සේ වෙත ලිපියක් නිකුත් කළ යුතුය.

01.5.3.3 විහාර දේවාලගම් පනතේ 4 (1) පාලනයේ පවතින විහාරස්ථාන හා දේවාලයන්හි භාරකාර පත්වීම් හා ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ ඇතුලු බස්නායක නිලමේවරුන් පත් කිරීම.

1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතේ 7 වන වගන්තිය යටතේ ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ පත් කරනු ලබන අතර ඔහුගේ ධුර කාලය වසර දහයක් වේ.එසේම යථෝක්ත ආඥා පනතේ 8 වගන්තිය අනුව බස්නායක නිලමේ පත් කරනු ලබන අතර ඔහුගේ ධුර කාලය වසර 05ක් වේ.බස්නායක නිලමේ වරයෙකුගේ නිල කාලය අවසන් වූ පසු අතිගරු ජනාධිපතිතුමා වෙත වර්ෂය බැගින් ධුර කාලය දෙවරක් දීර්ඝ කිරීමේ හැකියාව පවතින අතර නිල කාලය අවසන් වූ පසු නිලවරණයක් පවත්වා දියවඩන නිලමේ,බස්නායක නිලමේ තනතුර සඳහා පුද්ගලයන් තෝරා පත්කරගනු ලැබේ.

විහාරස්ථානයක භාරකාරවරයෙකු පත් කිරීමේදී විහාර දේවාලගම් ආඥා පනතේ 10 වන වගන්තිය යටතේ පත් කිරීම් සිදු කරනු ලබන අතර එහිදී විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් භාරකාරධූරය සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමෙන් පසු වසර පහක් සඳහා පත් කිරීම සිදු කරනු ලබන අතර භාරකාර ධූරය සඳහා විහාරාධිපති ස්වාමීන් වහන්සේට ද පත්විය හැකිය.

යථෝක්ත දියවඩන නිලමේ,බස්නායක නිලමේ සහ භාරකාර ධූරය වෙනුවෙන් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ මුදලින් ඇප තැන්පත් කළ යුතුය.එහිදී අදාල සිද්ධස්ථානයේ ආසන්නතම වර්ෂයට අදාළ අර්ධ වාර්ෂික අයවැය වාර්තාවන්හි ආදායම් ශීර්ෂයෙහි එකතුවෙන් 5% ක ප්‍රමාණයක් ඇප මුදල වශයෙන් තැබිය යුතු වේ.

01.5.3.4 විහාර දේවාලගම් පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන වල අනුමාන අයවැය හා අර්ධ වාර්ෂික අයවැය ගෙන්වා ගැනීම හා වත්කම් ලේඛන සකස් කිරීම භාරකාර සිද්ධස්ථාන වල කටයුතු විගණනය සඳහා යොමු කිරීම

විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථානයන් වෙත දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද අනුමාන අයවැය වාර්තාව ඉදිරි වර්ෂයට අදාළව අදාළ සිද්ධස්ථානයේ දියවඩන නිලමේ, බස්නායක නිලමේ සහ භාරකාරතැන විසින් සකස් කර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වේ. එසේම මාස හයකට වරක් එම වර්ෂයේ සත්‍යාය ආදායම්

වියදම් ඇතුළත් කරමින් අර්ධ වාර්ෂික අයවැය වාර්තාවන් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කළ යුතු වේ.
සිද්ධස්ථානයන්හි දේපල සම්බන්ධ තොරතුරු ඇතුළත් කරමින් දෙපාර්තමේන්තුව මගින් වත්කම් ලේඛන සකස් කරනු ලබන අතර එහි පිටපතක් දෙපාර්තමේන්තුවට ද අදාළ සිද්ධස්ථානයේ දියවඩන නිලමේ, බස්නායක නිලමේ සහ භාරකාරතැන වෙත භාර දෙනු ලැබේ.එසේ වත්කම් ලේඛනයක් සකස් කිරීම තුළින් එම ධුර සඳහා පත්වන පුද්ගලයන් සඳහා හාණ්ඩ,ලිපිගොනු ආදිය භාර දීමේදී විනිවිදභාවයෙන් සිදු කළ හැකි වේ.

භාරකාර සිද්ධස්ථානවල විගණන කටයුතු සිදු කිරීම තුළින් අක්‍රමිකතා වළක්වා ගැනීමටත් විනිවිදභාවයකින් සිද්ධස්ථානයේ පරිපාලන හා මූල්‍ය කටයුතු පවත්වා ගැනීමට අවශ්‍ය උපදෙස් හා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීමටත් හැකියාව ලැබේ.එසේම තම වගකීම පැහැර හරින අවස්ථාවලදී අදාළ දියවඩන නිලමේ, බස්නායක නිලමේ සහ භාරකාරතැන ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමටද විගණන පරීක්ෂණවලදී හැකියාව ලැබේ.

01.5.3.5 විහාර දේවාලගම් පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථානයන්හි පඬුරු මුදල් බැංකු ගත කිරීමේ අධීක්ෂණ කටයුතු

විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන ආදායම් ලබන සිද්ධස්ථානයන්හි පඬුරු මුදල් ගණනය කිරීමේ සහ බැංකුගත කිරීමේ කටයුතු අධීක්ෂණය සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් සහභාගී වේ.එහිදී එම පඬුරු මුදල් ගණනය කිරීම සහ බැංකුගත කිරීමේ කටයුතු විධිමත්ව සහ විනිවිදභාවයකින් සිදු කිරීම මෙහි අරමුණ වන අතර එම පඬුරු මුදල් ආදායම් වාර්තාවන්හි එක් පිටපතක් දෙපාර්තමේන්තුවේ ද ගොනු ගත කරනු ලබයි.

01.5.3.6 සිද්ධස්ථාන සතු ඉඩම් බදු දීමේ කටයුතු.

සිද්ධස්ථාන සතු ඉඩම් බදු දීමේදී විහාර දේවාලගම් ආඥා පනතේ 29 වගන්තිය අනුව බදු දීම් කටයුතු සිදු කරනු ලබයි.එහිදී බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් ලබාදෙනු ලබන බදු අයදුම්පත සම්පූර්ණ කර බදු ලබා දෙන ඉඩමේ පිඹුරේ පිටපතක් සහ බදු ගැනුම්කරුගේ හැඳුනුම්පතෙහි පිටපතක් සමග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව බදු ගන්නා කාර්යය අනුව ප්‍රාදේශීය ලේකම් වාර්තාව, තක්සේරු දෙපාර්තමේන්තුවේ වාර්තාව සහ අනෙකුත් අදාළ ආයතනයන්හි වාර්තාවල නිර්දේශ අනුව බදු දීමේ කටයුතු සිදු කරනු ලබයි.එහිදී බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ අත්සනින් යුතුව බදු ඔප්පු සකස් කරනු ලබයි.එසේම බදු දීමේදී වර්ෂ 05 කට වරක් ප්‍රදේශයේ පවතින මිල ගණන් අනුව බදු මුදල සංශෝධනය කිරීම ද සිදු කරනු ලබයි.

01.5.3.7 බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම.

සිද්ධස්ථානයක පවතින ලියාපදිංචිය, විහාරාධිපති ධුරය, ඉඩම් ආදී සිද්ධස්ථානය සම්බන්ධව ගැටළු පිළිබඳව නඩුවක් අධිකරණයේදී විභාග වන අවස්ථාවලදී බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙනුවෙන් අදාළ අධිකරණයේ පෙනී සිටීම සිදු කරනු ලබයි.

01.5.3.8 සෙසු කාර්යයන්

1. විහාරාධිපති ධුරය සංශෝධනයන් සිදුකිරීම.
2. අපවත් වූ ස්වාමීන් වහන්සේලා සතු වූ බැංකු මුදල් අදාළ විහාරස්ථානයන්හි සංවර්ධන කටයුතු සඳහා නිදහස් කිරීම.
3. විහාරස්ථාන හා දේවාල සන්තක ඉඩම්වල ගස් කැපීම හා විකිණීමට අනුමැතිය ලබා දීම.
4. පූජා ඔප්පු සඳහා නිර්දේශ ලබා දීම.
5. අපවත් වූ ස්වාමීන් වහන්සේලාගේ වාහන පැවරීම් කටයුතු.
6. භික්ෂූන් වහන්සේලා විසින් පෞද්ගලික මිලදීගත් දේපල අදාළ ඉල්ලීම් මත සඟසතු නොවන බව දැනුම් දීම.
7. වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුව සතු ඉඩම් වල පවත්වාගෙන යනු ලබන ආරණ්‍ය සේනාසන සඳහා නිර්දේශ ලබා දීම.
8. මැණික් පතල් බලපත්‍ර සඳහා නිර්දේශ ලබා දීම.

9. සිද්ධස්ථාන සතු ඉඩම් වෙනුවෙන් හිමි මහා භාරකාර දෙපාර්තමෙන්තුවේ තැන්පත් වන්දි මුදල් අදාළ සිද්ධස්ථානයන්හි සංවර්ධන කාර්යයන් වෙනුවෙන් නිදහස් කිරීමට අදාළ රාජකාරි.
10. මහා භාරකාර දෙපාර්තමේන්තුවේ තැන්පත් විවිධ භාරයන්හි පොලී මුදල් එම සිද්ධස්ථානයේ පරිපාලන කටයුතු සහ සංවර්ධන කාර්යයන් වෙනුවෙන් නිදහස් කිරීමට අදාළ කටයුතු.

01.5.4 භික්ෂු ලියාපදිංචි අංශය

1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතේ අංක 41 හි සඳහන් විධානයන් ක්‍රියාත්මක කිරිම භික්ෂු ලියාපදිංචි අංශය මගින් සිදු කරනු ලබයි.

01.5.4.1 ප්‍රධාන කාර්යන්

- නව සාමණේර ප්‍රකාශ පත්‍ර ලියාපදිංචි කිරීම.
- නව උපසම්පදා ප්‍රකාශ පත්‍ර ලියාපදිංචි කිරීම.
- ලියාපදිංචි කරන ලද සාමණේර සහ උපසම්පදා ප්‍රකාශ පත්‍ර වල සහතික පිටපත් නිකුත් කිරීම
- සාමණේර සහ උපසම්පදා ප්‍රකාශ පත්‍රවල අවශ්‍ය සංශෝධන සිදු කිරීම.
- උපැවිදි සහතික නිකුත් කිරීම
- නීතිමය ගැටලු වලදී අවශ්‍ය සාක්ෂි ලබා දීම
- භික්ෂු හැදුනුම්පත් නිකුත් කිරීම

01.5.4.2 විශේෂ වැඩ සටහන්

- නවක සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලාගේ ආකල්ප සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- සාමණේර හා උපසම්පදා ලේඛණ හා තොරතුරු පරිගණක ගත කිරීම

01.5.4.3 2021.01.01 සිට 2021.12.31 දින දක්වා ප්‍රධාන කාර්යන්ට අදාළ කාර්ය සාධනය

- ලියාපදිංචි කරන ලද සාමණේර ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව - 2,972
- ලියාපදිංචි කරන ලද උපසම්පදා ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව - 348
- ලියාපදිංචි කරන ලද සහතික වල සිදු කරන ලද සංශෝධන සංඛ්‍යාව - 379
- නිකුත් කරන ලද සාමණේර, උපසම්පදා සහතික පිටපත් සංඛ්‍යාව - 16,919
- නිකුත් කරන ලද උපැවිදි සහතික සංඛ්‍යාව - 1,495
- නිකුත් කරන ලද භික්ෂු හැඳුනුම්පත් සංඛ්‍යාව - 72

01.5.4.4 2021.01.01 සිට 2021.12.31 දින දක්වා විශේෂ වැඩ සටහන් වලට අදාළ කාර්ය සාධනය

(අ) සාමණේර හා උපසම්පදා ලේඛණ හා තොරතුරු පරිගණක ගත කිරීම

1931අංක 19 බෞද්ධ විහාර දේවාලගම් පනතට අනුව පැවිදි දිවියට ඇතුළත් වන සහ උපසම්පදාව ලබන සියළු භික්ෂූන් වහන්සේලා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතුය.එම ආඥා පනත බලාත්මක වූ දා පටන් මේ දක්වා 2021-11-25 දින වන විට සාමණේර ලේඛණ 112511ක් උපසම්පදා ලේඛණ 57837ක් ලියාපදිංචි කර ඇත.
එම පනතට අනුව යම් අවශ්‍යතාවයක් මත එකී ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉල්ලූ විට නියමිත ගාස්තු අය කර ගැනීමෙන් පසු ලබා දීම බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වරයා සතු වගකීමකි.විශාල පිරිසක් දෛනිකව තම සහතික පත්‍රයෙහි පිටපත් ඉල්ලා පැමිණෙන අතර ඔවුන් තම සහතිකයේ ලියාපදිංචි අංකය නොදැනීම නිසා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් විධිමත් ලෙස යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලබන සාමණේර හා උපසම්පදා රෙජිස්ටරයෙන් ලියාපදිංචි අංකය සොයා ගැනීමට සිදුවේ.මෙය ඉතා වෙහෙසකර හා විශාල කාලයක් ගත වන කටයුත්තක් බැවින් එය ඉතා පහසුවෙන් සිදු කර ගත හැකි වන පරිදි නවීන තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතා කරමින් මෙම සියළු ලේඛණ හා තොරතුරු පරිගණක ගත කිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් නිර්මාණය කර දත්ත පද්ධතියක් සකස් කර ඇත. එම දත්ත පද්ධතියට 2021-01-01සිට 2021-11-25 දින දක්වා කාලය තුල සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලාගේ තොරතුරු හා ලේඛණ 28200 ඇතුලත් කර ඇති අතර ඉන් 24500 තොරතුරු යාවත්කාලීන (Accept) කර ඇත.

එසේම මෙම මෘදුකාංගය භාවිත කරමින් මේ වන විට දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල වන රත්නපුර, මහනුවර , කුරුණෑගල යන කාර්යාල මගින් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් සාමණේර හා උපසම්පදා සහතික පිටපත් නිකුත් කිරීමට කටයුතු යොදා ඇත.
එමගින් දුෂ්කර පළාත් වල සිට බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට පැමිණ ඉටු කර ගත යුතුව තිබූ කටයුත්තක් තමාට පහසු ප්‍රදේශයකින් කර ගැනීමේ හැකියාව ලැබී ඇත.

(ආ) නවක සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලාගේ ආකල්ප සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම

I. හැඳින්වීම

සම්බුදු සසුනේ චිරස්ථිතිය හා අභිවෘද්ධිය වෙනුවෙන් නවක සාමණේර සහ උපසම්පන්න භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය කරන්නා වූ දැනුම අවබෝධය සහ හික්මීම කුඩා කල සිටම ලබා දීම අරමුණු කරගනිමින් බුද්ධශාසන අමාත්‍යාංශය සහ බෞද්ධ කටුයතු දෙපාර්තමේන්තුව එක්ව ලංකාවේ වැඩසිටින නවක සාමණේර හා උපසම්පන්න භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් අතිපූජ්‍ය මහානායක ස්වාමීන් වහන්සේලාගේ හා විද්වත් ස්වාමීන් වහන්සේලාගේ අනුශාසන පරිදි දිස්ත්‍රික් මට්ටමින් පුහුණු කිරීමේ වැඩ සටහනක් 2017 වර්ෂයේදී ආරම්භ කරන ලදි.

සාමණ්ර පුහුණු වැඩ සටහන

II. අරමුණු

- දැනට ලංකාවේ වැඩ වාසය කරන නවක සාමණේර ස්වාමීන් වහන්සේලාගේ ඇවතුම් පැවතුම්, ආගමික වත්පිළිවෙත් හා පැවිදි දිවිය සාර්ථක කර ගැනීමට අවශ්‍ය මූලික දැනුම ලබා දීම හා ප්‍රායෝගික පුහුණුව ලබා දීම.
- සා.මණේර ස්වාමීන් වහන්සේලාට ආගමික කටයුතු ඉටු කිරීම පිළිබඳව පුහුණුවක් ලබා දීම හා ස්වාමීන් වහන්සේලාගේ දැනුම, කුසලතා, ආකල්ප වර්ධනය කිරීම

III. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සාමණේර ස්වාමීන් වහන්සේලාගේ

- පෞරුෂ සංවර්ධනය(ඉදිරිපත්වීම, අභියෝග භාර ගැනීම, දරා ගැනීමේ ශක්තිය හා ඉවසීම ඇති කිරීම, සබකෝලය මග හැර ගැනීම)
- හැකියාවන් හා කුසලතා හඳුනා ගැනීම
- සාමුහිකව කටයුතු කිරීමේ හැකියාව ඇති කිරීම
- සාසනික වත් පිළිවෙත් හුරු කරවීම
- අන් අයට හා අන් මතයන්ට ගරු කිරීම
- ත්‍රිපිටකාශ්‍රිත මූලික දැනුම වර්ධනය කිරීම
- පාලි, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාවන් පිළිබඳ මූලික අවබෝධය
- දේශනා, ගායනා සහ සජ්ඣායනා පිළිබඳ කුසලතා වර්ධනය
- භාවනාව පිළිබඳ මූලික අවබෝධය
  යන කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් මෙම පුහුණු වැඩ සටහන පවත්වනු ලබයි.

IV. වැඩ සටහන පවත්වන ක්‍රමවේදය

මෙම වැඩ සටහන නේවාසික පුහුණුවක් ලෙසින් පැවැත්වේ. දෛනික කාල සටහනකට අනුව විද්වත් ස්වාමීන් වහන්සේලා විසින් පවත්වනු ලබන දේශන හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් පුහුණුව ලබා දීම සිදු කරනු ලබයි.

2021-01-0-1 සිට 2021-11-27 දින දක්වා නවක සාමණේර හා උපසම්පදා ස්වාමීන් වහන්සේලාගේ ආකල්ප සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම පිළිබඳ තොරතුරු

වැඩ සටහන පැවැත්වූ දින	වැඩ සටහන පැවැත්වූ ස්ථානය	ආවරණය කල දිස්ත්‍රික්කය	වැඩ සටහන සහභාගිවූ සංඛ්‍යාව
2021-02-06- දින සිට 2021-02-13 දක්වා	හන්තාන සිරි ධම්මරතන ත්‍රිපිටක ධර්මායතන පිරිවෙන	මහනුවර	87
2021-11-20 දින සිට 2021-11-27 දක්වා	පන්නිපිටිය දෙවරම් මහා විහාරය.	කළුතර	56

01.05.04 නීති අංශය

<u>නඩු ගොනුවල ප්‍රගතිය</u>

කාරණය	නඩු ගොනු ආරම්භ කිරීම									
	2014.08.15 ට පෙර	2014.08.15 සිට 2015 තෙක්	2015	2016	2017	2018	2019	2020	2021	එකතුව
2021.11.30 දින වන විට විභාග වන නඩු ගණන	40	5	8	8	8	16	27	16	18	**146**
2021.11.30 දින වන විට අවසන් වී ඇති නඩු ගණන	54	1	12	8	11	14	8	2	2	**112**
එකතුව	**94**	**6**	**20**	**16**	**19**	**30**	**35**	**18**	**20**	**258**

නඩු ගොනුවල ප්‍රගතිය එක් වර්ෂයකට අදාළව පමණක් දැක්විය නොහැකි අතර 2006 වර්ෂයේ සිට මේ දක්වා ගරු බුද්ධශාසන අමාත්‍යතුමා, බුද්ධශාසන අමාත්‍යාංශ ලේකම්තුමා, බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්තුමා ඇතුළු බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට විරුද්දව විත්තිකරුවන් හෝ වගඋත්තරකරුවන් ලෙස නම්කරමින් ගොනු කර තිබෙන නඩුවලින් මෙතෙක් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට විරුද්ධව තීන්දු ලබා දී නොමැති අතර ගොනු වී තිබෙන නඩු 258න් 112 ක්ම අවසන් වී තිබෙන්නේ එම නඩුවලින් වගඋත්තරකරු හෝ විත්තිකරු වන පාර්ශ්වයන් නිදහස් කිරීම මුදා හැරීම හෝ සමථයකට පත්කිරීම මගිනි. මෙම නඩු අවසන් වී තිබුණ ද එම නඩු තීන්දුවලට විරුද්ධව ඉහළ අධිකරණවල අභියාචනා කිරීම මත එම නඩු ගොනු නැවත යාවත්කාලීන කිරීමට ද සිදුවේ.

<u>නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත නඩුවල කටයුතු සිදු කිරීම</u>

අනු අංකය	කාර්යය	ප්‍රගතිය
1	නඩුවලට අදාළව ගොනු ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම	100%
2	නඩුවලට අදාළව විෂය ගොනු එක්රැස් කිරීම	100%
3	අදාළ ලේඛන රැස් කිරීම	100%
4	ලේඛන ඡායා පිටපත් කිරීම	100%
5	පෙරකලාසි ගොනු කිරීම	100%
6	දිවුරුම් ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම	100%
7	විෂය ගොනු අධ්‍යයනය කොට නඩු නිරීක්ෂණ සකස් කර ඉදිරිපත් කිරීම	100%
8	සාක්ෂි ලැයිස්තු සකස් කිරීම	100%
9	නඩු සඳහා අවශ්‍ය වන අවස්ථාවලදී අධිකරණයේ පෙනී සිටීම	100%
10	නඩුවලට අදාළ විභාග සටහන් සහ කාර්ය සටහන් පිටපත් ලබා ගැනීම	100%
11	නීතිපති දෙපාර්තමේන්තුව දැනුම් දෙන අවස්ථාවල දී අවශ්‍ය ලේඛන ඉදිරිපත් කිරීම	100%
12	නීති උපදේශනය සඳහා සහභාගි වීම	100%

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ විවිධ අංශ සහ ප්‍රාදේශීය කාර්යාලවලින් යොමු කරන ගොනු සඳහා නිරීක්ෂණ ලබාදීම හා වෙනත් කාර්යයන්හි ප්‍රගතිය

අනු අංකය	කාර්යය	ඉදිරිපත් වී ඇති සංඛ්‍යාව	නිරීක්ෂණ/පිළිතුරු ලබාදුන් සංඛ්‍යාව	ප්‍රගතිය (%)
1	**දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශවලින් යොමුකරන ගොනු සඳහා නිරීක්ෂණ ලබාදීම**	74	68	91.9
1.1	සිද්ධස්ථාන සතු දේපළ අයිතිය පිළිබඳ නිරීක්ෂණ	31	27	87.1
1.2	බදු කෙටුම්පත් පරීක්ෂාව	28	27	96.4
1.3	වෙනත්	15	14	93.3
2	**ප්‍රාදේශීය කාර්යාලවලින් යොමුකරන ගොනු සඳහා නිරීක්ෂණ ලබාදීම**	11	11	100
3	**බුද්ධශාසන අමාත්‍යාංශය මගින් යොමු කරන නඩු හා පනත් සම්බන්ධ නිරීක්ෂණ ලබාදීම**			100
4	**ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම**			100

01.5.5 දහම් පාසල් අංශය

01.5.5.1 දහම් පාසල් ලියාපදිංචිය

ගුණගරුක සමාජයක් ඇතිකිරීමේ අරමුණින් පිහිටුවා ඇති බෞද්ධ දහම් පාසල් සියල්ල බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ දහම් පාසල් අංශය විසින් ලියාපදිංචි කරනු ලබන අතර ඒ අනුව මෙම ලියාපදිංචි දහම් පාසල් සඳහා අවශ්‍ය පෙළ පොත් හා නාමලේඛන ලබාදීම, දහම් පාසල් ශ්‍රේණි විභාගය හා සිසු නිපුනතා වැඩසටහන් පැවැත් වීම ආදි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

2021 ට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි දහම් පාසල් සංඛ්‍යාව 11109

ප්‍රස්තාරය 03.1 - ශ්‍රී ලංකාවේ ලියාපදිංචි දහම් පාසල් සංඛ්‍යාවේ ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි දහම් පාසල් සංඛ්‍යාවේ ප්‍රගතිය පහත පරිදි වෙයි.



01.5.5.2 දහම් පාසල් ශ්‍රේණි විභාගය පැවැත්වීම

ශ්‍රී ලංකාව පුරා සියලුම දහම් පාසල්වල ඉගෙනුම ලබන දරුවන්ගේ දහම් දැනුම පරීක්ෂා කිරීම අරමුණින් පවත්වනු ලබන මෙම ශ්‍රේණි විභාගය සෑම වසරකම නොවැම්බර් මස අවසානයේ පවත්වනු ලබයි.

2020 වර්ෂයේ විභාගය සඳහා මධ්‍යස්ථාන 10262 ක අයදුම්කරුවන් 1067946 ඉදිරිපත් වීමට නියමිත වූවද COVID 19 වසංගත රෝග තත්වය නිසා දහම් පාසල් වසා තිබීම හේතුවෙන් විභාගය පැවැත්වීමට නොහැකි විය. 2021 වර්ෂයේද දහම් පාසල් නොපැවැත්වීම නිසා විභාගය පැවැත් වීමට නොහැකි වූ අතර එම විභාගය 2022 අප්‍රේල් 03 දින පැවැත්වීමට කටයුතු සූදානම් කරමින් පවතී.

වර්ෂය	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021
අපේක්ෂක සංඛ්‍යාව	777,576	787,692	808,161	813,432	855,868	950,274	913,720	976,639	988,262	1062946	1062946	*2021 වර්ෂයේද දහම් පාසල් නොපැවැත් වීම නිසා විභාගය පැවැත් වීමට නොහැකි විය 2022 අප්‍රේල් 03 පැවැත් වීමට නියමිතය.*
මධ්‍යස්ථාන සංඛ්‍යාව	3,884	5,758	3,920	3,830	3,842	3,907	3,938	3,361	3940	3989	10262	

01.5.5.3 දහම් පාසල් ගුරු සිසු තොරතුරු රැස් කිරීම හා පවත්වාගෙන යාම

දහම් පාසල් ගුරුවරුන්ගේ සංවර්ධනය ඉලක්කකරමින් සැලසුම් සකස් කිරීම හා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ලබාගැනීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. 2021 තොරතුරු අනුව ලියාපදිංචි දහම් පාසල් සංඛ්‍යාව 11109 ක් පවතින අතර ගුරුවරු 133416 යටතේ සිසුන් 2258383 ඉගනුම ලබති.
2021 වර්ෂයේ දී 2022 වසර සඳහා දහම් පාසල් ගුරු සිසු තොරතුරු රැස් කිරීමේ ආකෘති පත් 250000 ක් මුද්‍රණය කර ඇති අතර වියදම් වූ මුදල සම්බන්ධව මුද්‍රණාලයෙන් බිල්පත් මෙතෙක් ලැබී නොමැත.



2021වර්ෂයේ දී දිස්ත්‍රික්ක 21 ක දහම් පාසල් 10316 ක ශිෂ්‍ය සංඛ්‍යාව 2287587කි.



2021- දහම් පාසල් ගුරුවරුන් සංඛ්‍යාව





දිස්ත්‍රික් මට්ටමින්
2021- දහම් පාසල් සංඛ්‍යාව-10320



(දිස්ත්‍රික්කය)

01.5.5.4 126 වන දහම් පාසල් දිනය සැමරීම

ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ දහම් පාසල වන ගාල්ල, වැලිවත්ත, විජයානන්ද දහම් පාසැල 1895 අගෝස්තු මස 03 වන දින ආරම්භ කර ඇති අතර එම දිනය සමරනු වස් සෑම වර්ෂයකම අගෝස්තු 03 වැනි දින ජාතික දහම් පාසැල් දින සැමරුම් ජාතික මහොත්සවය පැවැත්වේ.
2021 වර්ෂයට යෙදුණු 126 වැනි දහම් පාසල් දින සැමරුම් ජාතික වැඩසටහන අගෝස්තු 03 දින පැවැත් වීමට සියලු කටයුතු සූදානම් කර තිබූ නමුත් රටේ පවතින කොවිට් 19 වසංගත තත්වය නිසා එය පැවැත්වීමට නොහැකි විය.

01.5.5.5 ගුරු භවතුන් සඳහා පුස්තකාල දීමනා හා නිල ඇඳුම් ලබා දීම

නිස්සරණාධ්‍යාශයෙන් දහම් පාසල් ගුරු සේවයේ නියුතු ගුරු භවතුන් දිරි ගන්වමින් ඔවුන්ගේ සේවය අගයනු වස් දහම් පාසල් ගුරු සේවයේ අඛණ්ඩ වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ වයස අවුරුදු දහඅටක් සම්පූර්ණ සෑම ගුරුවරයෙකුටම 2004 වසරේ සිට නිල ඇඳුමක් ප්‍රදානය කරනු ලබයි.

නිල ඇඳුමක් ලැබීම පිළිබඳ සෑම ගුරුවරයෙකු ම පසු වන්නේ යහපත් ආකල්පයකිනි. නිල ඇඳුම් ප්‍රදානයත් සමඟ දහම් පාසල් ගුරුවරුන්ගේ ශීඝ්‍ර වර්ධනයක් ඇති වී තිබෙන බව ද දැකිය හැකිය. ඒ සමඟම දහම් පාසල් සිසු දරු දැරියන්ගේ ද වර්ධනයක් ඇති වී තිබේ. 2021 වර්ෂයේ නිල ඇඳුම් ලබාදීම සඳහා රු. මිලියන 120 ක් වෙන්කරන ලදී. මෙම මුදලින් කාන්තා ගුරුභවතුන් සඳහා සාරි 41500 ක් මිලදී ගෙන ඇත. පිරිමි ගුරුවරුන් සඳහා සුදු රෙදි ප්‍රමාණයක් සළුසළ ආයතනයට ඇනවුම් බාරදී ඇති අතර තවමත් අප වෙත එය ලැබී නොමැත.

01.5.5.6 දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය

දහම් පාසල් ගුරුවරුන් හට සුවිශේෂී වූ හා ගුරුවරුන්ගේ ඉහල ප්‍රතිචාරයක් පවතින දහම් පාසල් ගුරු සහතිකපත්‍ර විභාගය පැවැත්වීමේ මූලික අරමුණු රාශීයකි.

1. දැනට සේවයේ නියුතු දහම් පාසල් ගුරු භවතුන්ගේ අධ්‍යාපන සුදුසුකම් ඉහළ දැමීම.
2. දහම් පාසල්හි ඉගැන්වීම් කටයුතු වල නිරත වන ගුරු භවතුන්ගේ සේවය අගය කිරීම.
3. ගුරු භවතුන්ගේ දැනුම තව දුරටත් වර්ධනය කිරීම හා උසස් අධ්‍යාපනයට නැඹුරු කිරීම.
4. දහම් පාසල් ගුරු භවතුන් සඳහා සමාජ පිළිගැනීමක් ඇති කරලීම හා එමඟින් ඔවුන්ගේ සේවාව ජනතාවගේ ඇගයීමට ලක් කිරීම
5. දහම් පාසල් ගුරුභවතුන්ගේ මූලික සුදුසුකම් සපුරාලීම.



2021 වර්ෂයේ දිස්ත්‍රික්ක 19 ක අපේක්ෂකයන් සඳහා විභාග මධ්‍යස්ථාන 25 ක දී මෙම විභාගය පැවැත්වීමට මූලික කටයුතු සැලසුම් කරන ලදී. ඒ සඳහා ඉදිරිපත් වූ අයදුම්කරුවන් සංඛ්‍යාව 20461 ක් අතරින් 19648 දෙනෙක් විභාගය සඳහා සුදුසුකම් සපුරන ලදි.

මෙම විභාගය 2020 ජූනි 20 දින දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ පූර්ණ අධික්ෂණය යටතේ විභාග මධ්‍යස්ථාන 25 කදී පැවැත්වීමට තීරණය කර තිබූ නමුත් දිවයිනේ ඇතිවී ඇති කොවිඩ් **19** වසංගත තත්වය හේතුවෙන් පැවැත්වීමට නොහැකි විය

01.5.5.7 දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම

දහම් පාසල් සිසු දරු දැරියන්ගේ දැනුම වර්ධනය කිරීම උදෙසාත්, බුදු දහමේ ඉගැන්වීම් ප්‍රායෝගිකව යොදා ගැනීම සඳහා අවස්ථාව ලබාදීම මගින් නැණ ගුණ සපිරි දරු පරපුරක් බිහි කිරීම උදෙසා පවත්වනු ලබන සිසු නිපුණතා ඇගයීම් වැඩසටහන වාර්ෂිකව පවත්වනු ලැබේ.

මෙම සිසු නිපුණතා ඇගයීම වැඩසටහන දහම් පාසල් , ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල, දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල, සමස්ත ලංකා යනාදි වශයෙන් අදියර හතරකින් පවත්වනු ලබන අතර දහම් දැනුම,රචනා,චිත්‍ර,ගායනා අදී ක්ෂේත්‍ර නියොජනය කරමින් ඇඟයීම් ඉසව් 41 සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. 2019 වසරේදී ප්‍රදේශීය වශයෙන් දහම් පාසල් සිසුන් 453050 සහභාගී වූ අතර දිස්ත්‍රික්ක ඇඟැයීම සඳහා සිසුන් 13243 ද සමස්ත ලංකා ඇඟැයීම සඳහා 902 ඉදිරිපත් වී ඇත.

දිවයිනේ උත්ගතවී ඇතිවී ඇති කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් මෙවර ඇගයීමේ වැඩසටහන පැවැත්වීමට නොහැකි විය.

01.5.5.8 දහම් පාසල් පෙළපොත් සංස්කරණය හා මුද්‍රණය

සදාචාරවත් සමාජයක් බිහි කිරීම උදෙසා අත්‍යවශ්‍ය වන දහම් පාසල් අධ්‍යාපනය වැඩි දියුණු කිරීම අරමුණු කර ගෙන දහම් පාසල් පෙළ පොත් සංස්කරණය, මුද්‍රණය හා දහම් පාසල් වෙත බෙදා හැරීම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

2021 වසර සඳහා අවශය වන පෙළ පොත් 3021300 ක් මුද්‍රණය සඳහා ද මිලියන 160ක් වැයකරන ලද අතර 2022 වර්ෂයට අවශ්‍ය පෙළ පොත් ප්‍රමාණය ගුරු සිසු ලේඛන හො ඔන්ලයින් ක්‍රමය මඟින් දහම් පාසල් මඟින් ලබාගත් තොරතුරු මත ප්‍රතිශතය තීර්නය කොට පෙළ පොත් මුද්‍රණය සිදු කරනු ඇත. මෙම පොත් මුද්‍රණය කිරීම 2021 වර්ෂයේ රජයේ මුද්‍රණාලයෙන් සිදු කරන ලදි. ඒ සඳහා වෙන් කරන ලද මුදල රු. මිලියන 210 කි ක් ද, වැය වූ සම්පූර්ණ වියදම රු. මිලියන 164 කි.

මුද්‍රණය කරන ලද පොත් වේයන්ගොඩ ගබඩාවට ලබා දීමෙන් පසු ප්‍රාදේශීය ශාසනාරක්ෂක මන්ඩල වෙත ප්‍රවාහනය කරනු ලබයි.

මුළු දිස්ත්‍රික්ක ගණන	= 22
ප්‍රදේශිය ශාසනාරක්ෂක මණ්ඩල ගණන	= 325
දහම් පාසල් ගණන	= 10296
බෙදා හරින ලද මුළු පොත් ගණන	= 2026735

දහම් පාසල් පෙළ පොත් බෙදීම 2021 - සාරාංශය

01.5.5.9 බුද්ධ ජයන්ති පොත් හල

මහජනතාවගේ දහම් දැනුම වර්ධනයට මහත් සේ උපකාරී වන සුවිශේෂී දහම් පොත් රාශියක් මුද්‍රණ පිරිවැයට මහජනතාව වෙත ලබාදීම සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ඇති බුද්ධ ජයන්ති පොත් හල පවත්වාගෙන යනු ලබයි. සංක්ෂිප්තව සරල සිංහලයට නගන ලද ත්‍රිපිටක ග්‍රන්ථ, බෞද්ධ විශ්වකෝෂ පොත් සිංහල හා ඉග්‍රීසි බසින් රචිත බෞද්ධ විචාර පොත් රාශියක් මෙහි අලවිය සඳහා තිබේ.

2021 /01/01 දින සිට 2021 12.13 දිනට පොත් අලෙවියෙන් රුපියල්. 649280.00 ක මුදලක් ලැබී ඇත. එම මුදල් ඒ ඒ දිනවල ප්‍රධාන කාර්‍යාලය වෙත භාරදී ඇත.

01.5.5.9 දහම් පාසල් ගුරු කුසලතා සංවර්ධන වැඩමුළු
දහම් පාසල් ගුරුවරුන්ගේ ගුරු කුසලතා සංවර්ධනය කිරීම.

මේ යටතේ 2021 වර්ෂයේ දිස්ත්‍රික් ගුරු පුහුණු සංචිතයක් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා බදවා ගැනීම් සිදුකර ඇත. වැඩසටහන සඳහා වෙන් වූ මුදල රුපියල් මිලියන 5 ක් වන අතර මූලිකව වැය වූ මුදල රුපියල් 75,000
කොවිඩ් වසංගත තත්වය නිසා පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වී ඇති අතර ඉතිරි ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයට යොමුකරන ලදී.

දහම් සරසවි ඩිප්ලෝමා වැඩසටහන

•දහම් පාසල් ගුරුභවතුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමග එක්ව දිස්ත්‍රික් ලේකම් කාර්යාල 19 ක අධීක්ෂණය යටතේ දහම් සරසවිය බුද්ධ ධර්ම ඩිප්ලෝමා පාඨමාලාව පවත්වනු ලබන අතර එහි දෙවන වසර විභාග කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාල 13 දී 2020.03.07,08,14 දිනවල පවත්වන්නට යෙදුනි.

•පාඨමාලාවේ පළමු වසර සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින් ඉදිරිපත් කර තිබූ රු. 5579000/- සංශෝධිත ඇස්තමේන්තුවට අනුව සම්පූර්න මුදල ගෙවා ඇත.

•පාඨමාලාවේ සම්මුඛ පරීක්ෂණය,සම්මුඛ පරීක්ෂණයේ සංග්‍රහ කටයුතු, දීමනා, ලිපිද්‍රව්‍ය වෙනුවෙන් එක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට රු.15,500/- බැගින් වන පරිදි දි.ලේ.කා 19 සඳහා රු.294,500/- ක මුදලක් වෙන් කිරීමට කටයුතු කර ඇත.

•නව පාඨමාලවේ සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා දෙපාර්තමේන්තුව එක්ව වසර දෙකක් සඳහා සකස් කරන ලද විෂය නිර්දේශය ඇතුළත් ගොණු 3000 ක් පමණ පාඨමාලා ලාභී දහම් පාසල් ගුරු භවතුන් වෙත ලබාදී ඇත.

•දහම් සරසවිය දහම් ගුරු උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු වසරේ දේශකවරු බඳවා ගැනීමේ කටයුතු සිදු කර ඇත.

•පාඨමාලාව පැවැත්වෙන මධ්‍යස්ථාන වෙත එම මධ්‍යස්ථානවල පොදු පහසුකම් වෙනුවෙන් එක් මධ්‍යස්ථානයකට මසකට රු 2000 බැගින් 740000.00 මුදලක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබාදී ඇත.

•දේශන ආරම්භ කිරීමෙන් පසු මධ්‍යස්ථාන 26 ක් වෙත දේශක දීමනා ගෙවීම වෙනුවෙන් අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත මුදල් වෙන් කළ යුතු වේ.

•ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත 2017 දහම් සරසවිය ඩිප්ලොමා පාඨමාලාව සඳහා වෙන්කරන ලද මුදලින් ඉතිරිවී ඇති රු.1,229,169.00 ක මුදලක් 2020 නව පාඨමාලාවේ මූලික කටයුතු කර ගැනීමට හැකි විය.

•2018/2019 බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සමග පවත්වන පාඨමාලාවේ දෙවන වසර පරීක්ෂණය නැවත පැවැත්වීමට තීර්ණය කර ඇත.

දහම් පාසල් ගුරු හැඳුනුම් පත් නිකුත් කිරීම.

නිස්සරනාද්‍යාසායෙන් දහම් පාසල් අධ්‍යාපනය ලබාදෙන ගුරු භවතුන් සඳහා වසරක අඛණ්ඩ සේවාකාලයක් සම්පුර්ණ කර ඇති දහම් පාසල් ගුරුභවතුන් සඳහා මෙම හැඳුනුම්පත නිකුත් කරනු ලබයි.

2021 වසර සඳහා ඉදිරිපත් වූ අයදුම් පත් 1511 කට අදාලව රු.130,550.00 මුදල් ප්‍රතිපාදන වැය කරමින් දහම් පාසල් ගුරු හැඳුනුම්පත් 1511ක් නිකුත් කර ඇත.

01.5.6 සංවර්ධන අංශය

01.5.6.1 ජාතික නිදහස් උත්සවය වෙනුවෙන් පවත්වන පිරිත් දේශනාව

ජාතික නිදහස් දිනය නිමිත්තෙන් රටට සහ ජනතාවට සෙත් පතා නිදහස් චතුරස්‍ර පරිශ්‍රයේ බෞද්ධාගමික වතාවත් සිදු කරනු ලැබේ.මෙය සෑම වසරකම පෙබරවාරි 02 වන දින රාත්‍රී පිරිත් පිංකම සහ පසුදින සංඝගත දක්ෂිණාව සමගින් පැවැත්වේ.ත්‍රෛනිකායික මහානායක ස්වාමීන් වහන්සේලාගේ උපදෙස් පරිදි වසරක් පාසා නිකායත්‍රය මාරු වෙමින් මෙහි සංවිධාන කටයුතු සිදු කරනු ලැබේ. 2021 වර්ෂයේද අවම ජන සහභාගිත්වයකින් පරිත්‍රාණ ධර්ම දේශනය පවත්වන ලදී.
ජාතික නිදහස් දිනපෙරවරුවේ සිදු කරනු ලබන සර්වාගමික වතාවත් අතුරින් බෞද්ධාගමික වතාවත් එක් විහාරස්ථානයක් කේන්ද්‍ර කර ගෙන සංවිධානය කරනු ලැබේ.ඒ අනුව 2021 වර්ෂයේ නිදහස් දින ආගමික වතාවත් පෙබරවාරි 04 වන දින උදෑසන ගරු විහාරාධිපති පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද ස්වාමීන් වහන්සේගේ මූලිකත්වයෙන් නාරාහේන්පිට අභයාරාමයේදී පවත්වන ලදී.නිදහස් දින ආගමික වතාවත් සඳහා සමස්ත වියදම රුපියල් 1,064,321.05 වැය විය.

01.5.6.2 පොසොන් උත්සවය රාජ්‍ය අනුග්‍රහය යටතේ පැවැත්වීම

වාර්ෂික රාජ්‍ය පොසොන් උත්සවය මිහින්තලා රාජ මහා විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් පැවැත් වේ.කොවිඩ් වසංගත තත්වයේ වුවද 2021 වර්ෂයේ පොසොන් රාජ්‍ය උත්සවය අවම ජන සහභාගිත්වයෙන් යුක්තව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙවරද සංවිධානය කළ අතර ඒ සඳහා මෙම දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබා දීමට හැකියාව ලැබිණි.

01.5.6.3 ආදාහන පූජෝත්සව

අපවත් වී වදාළ මහානායක ස්වාමීන් වහන්සේලාගේ ආදාහන උත්සව පූර්ණ රාජ්‍ය ගෞරව සහිතවද ප්‍රධාන පෙළේ නායක ස්වාමීන් වහන්සේලා සඳහා රාජ්‍ය අනුග්‍රහ සහිතවද ප්‍රාදේශීය භික්ෂූන් වහන්සේලා සඳහා ප්‍රතිපාදන ලබා දීමෙන්ද බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ආදාහන පූජෝත්සව සිදු කෙරේ.2021.01.01 සිට 2021.12.31 දක්වා ලබා දී ඇති ප්‍රතිපාදන මෙසේය.

	ආදාහන පූජෝත්සව	**ලබා දී ඇති ප්‍රතිපාදන**	**වෙන් කල ආයතනය**
01.	අතිපූජ්‍ය නාපාන පේමසිරි නායක ස්වාමීන්වහන්සේ	4,328,700.00	මහනුවර දිස්ත්‍රික් ලේකම්
02.	අති පූජ්‍ය කොටුගොඩ ධම්මාවාස මහා නායක ස්වාමීන්වහන්සේ	8,169,660.00	කොළඹ දිස්ත්‍රික් ලේකම්
03.	පූජ්‍ය අඹේවෙල පඤ්ඤාසාර නායක ස්වාමීන්වහන්සේ	1,628,577.00	වැලිමඩ ප්‍රාදේශීය ලේකම්
	වැලමිටියාවේ කුසලධම්ම නායක හිමි පාණන් වහන්සේ	ලැබීමට නියමිතයි.	ගම්පහ දිස්ත්‍රික් ලේකම්
	ආදාහන පූජෝත්සව (2021.12.31 දිනට) ස්වාමීන් වහන්සේලා 299 ක් සඳහා	2,928,022.00	ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත
	එකතුව	**17,054,959.00**	**ස්වාමීන්වහන්සේලා 301 නමක් සඳහා)**

01.5.6.4 උපසම්පදා උත්සව

ශාසනයේ තිර පැවැත්ම සඳහා සුපේශලකාමී ස්වාමීන් වහන්සේලා සිටීම අත්‍යවශ්‍ය කරුණකි.මේ යටතේ සියලුම නිකාය පාර්ශව සංවිධානත්වයෙන් පැවැත්වෙන නවක උපසම්පදා උත්සව වෙනුවෙන් රාජ්‍ය අනුග්‍රහය ලබා දීම යටතේ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් රුපියල් 3000 බැගින් සියලුම ස්වාමීන් වහන්සේලා සඳහා ප්‍රතිපාදන ලබා දීම සිදු කරනු ලැබේ.මේ යටතේ 2021 වර්ෂයේ ලබා දුන් ප්‍රතිපාදන පහත පරිදි වේ.

අනු අංකය	නිකාය පාර්ශ්වය	ප්‍රතිපාදන යොමු කළ ප්‍රා.ලේ කොට්ඨාසය	උපසම්පදා අපේක්ෂිත ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව	වෙන් කළ ප්‍රතිපාදන (රු.)
01.	සියාමෝපාලි වංශික මහා නිකායේ ශ්‍රී රෝහණ මහා සංඝ සම්ප්‍රදාය 36 වන උපසම්පදාව	කඹුරුපිටිය	40	120,000.00
02.	අමරපුර මහා නිකායේ මුම්මවංශාභිධජ සිරි සද්ධම්ම යුක්තික පාර්ශ්වයේ උපසම්පදාව	ගාල්ල කඩවත්සතර	23	69,000.00
03.	කෝට්ටේ ශ්‍රී කළ්‍යාණී ධර්ම මහා සංඝ සභාව		87	261,000.00
එකතුව			**63**	**450,000.00**

01.5.6.5 රාජ්‍ය වෙසක් උත්සවය

වාර්ෂිකව රජයේ අනුග්‍රහය මගින් සිදු කරන රාජ්‍ය වෙසක් උත්සවය පැවැත්වීමට නියමිතව තිබුයේ මැයි 24 හා 26 දිනයන්හි නාගදීප විහාරස්ථානයේදී වුවත් කොරෝනා වසංගත තත්වය මත එය නොපැවැත්විණි.

ශාසනික සංවිධාන කටයුතු

බුදු සසුනේ උන්නතිය චිරස්ථිතිය දිවයින පුරා තිබෙන බෞද්ධ ශාසනික සංවිධාන ශක්තිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය ලබා දීම සිදු කරනු ලැබේ.ශක්තිමත් බෞද්ධ නායකත්වයක් තුළින් අධ්‍යාත්මික පිරිපුන් සමාජයක් බිහි කිරීම මෙහි අරමුණයි.

01.5.6.6 ශාසනාරක්ෂක මණ්ඩල ක්‍රියාත්මක කිරීම

බුද්ධ ශාසනයේ සුබසිද්ධිය ප්‍රවර්ධනය කිරීම සඳහාත් භික්ෂු සමාජයේ සංවර්ධනය සඳහාත් 2014 අංක 16 දරණ සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යටතේ සංස්ථාපනය කර ඇති සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල ක්‍රියාත්මක කිරීම සඳහා වන පහසුකම් සැපයීම බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.මේ යටතේ සමස්ත ලංකා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල නිලවරණ පැවැත්වීම විධායක සභා රැස්වීම් පැවැත්වීම සහ දිවයින පුරා ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා සඳහා ලිපිදව්‍ය හා ගමන්වියදම් ගෙවීම සිදු කරනු ලැබේ.2021 වර්ෂය සඳහා පහත පරිදි වියදම් දරා ඇත.

රැස්වීම	වියදම් වූ මුදල (රු.)
විධායක සභාව (2021/01/19)	108,070.00
අනුකමිටුව (2021/02/12)	19,320.00
විධායක සභාව (2021/03/09)	90,145.00
විශේෂ විධායක සභාව(2021/03/23)	81,630.00
විශේෂ විධායක සභාව(2021/04/09)	102,635.00
කල්පිටිය විශේෂ විධායක සභාව(2021/04/23)	38,910.00
මහා සභා (2021.11.23)	222,965.00
ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා 243 නමක් සඳහා ලිපි ද්‍රව්‍ය හා ගමන් වියදම් දීමනා	(293*15,000.00) 3,740,000.00
මුළු වියදම	**4,383,675.00**

මීට අමතරව ශාසනාරක්ෂක මණ්ඩල කටයුතු පහසු කරගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් වෙනුවෙන් පරිගණක ඇතුළු කාර්යාලීය උපකරණ ලබා දීමද දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ සිදු කරනු ලැබේ.

2021 වර්ෂයේ ලබා දුන් ප්‍රතිපාදන විස්තර පහත දැක් වේ.

දිස්ත්‍රික්කය	මුදල
පුත්තලම	1,255,000.00
මහනුවර	1,755,000.00
කෑගල්ල	695,000.00
මොණරාගල	560,000.00
මාතලේ	545,000.00

මාතර	900,000.00
ගම්පහ	1,175,000.00
කුරුණෑගල	385,000.00
රත්නපුර	1,395,000.00
අනුරාධපුර	1,310,000.00
බදුල්ල	520,000.00
කොළඹ	560,000.00
ගාල්ල	270,000.00
නුවරඑළිය	540,000.00
කළුතර	135,000.00
එකතුව	**12,000,000.00**

01.5.6.7 සිල්මාතා මණ්ඩල ක්‍රියාත්මක කිරීම

2002 වර්ෂය බුද්ධශාසන ජනාධිපති කොමිෂන් වාර්තාව අනුව සිල්මාතා ලියාපදිංචි කිරීම් කටයුතු සිදු කරනු ලබන අතර මේ යටතේ ජාතික,දිස්ත්‍රික් ප්‍රාදේශීය මට්ටමෙන් සිල්මාතා මණ්ඩල ක්‍රියාත්මක කරනු ලබන මෙම ශාසනික මණ්ඩල ක්‍රියාත්මක කිරීම සඳහා 2021 වර්ෂයේ රැස්වීම් 02 ක් පැවැත් වූ අතර වියදම් කරන ලද මුදල රුපියල් 255,450.00 ක් වේ.

01.5.6.8 නිකාය මූලස්ථාන කාර්යාල පවත්වාගෙන යාම

නිකාය මූලස්ථාන කාර්යාල පවත්වාගෙන යාම සඳහා ඒ ඒ නිකාය යටතේ පාලනය වන විහාරස්ථාන ප්‍රමාණය සැලකිල්ලට ගෙන කාර්යාල සඳහා දීමනාවක් ලබා දීම සිදු කරනු ලැබේ.මේ යටතේ කාර්යාල සේවකයන් හා රියදුරු දීමනාවක් ලෙස මසකට රු.20,000.00 බැගින් වසරකට 240,000.00ක් අවස්ථා 2 කදී ලැබෙන පරිදි ලබා දීම සිදු කෙරේ. 2021 වර්ෂයේ පහත පරිදි වියදම් දරා ඇත.

නිකාය පාර්ශ්වය	ලබා දුන් මුදල (රු.)
සියම් නිකායේ මල්වතු පාර්ශ්වය	240,000.00
අස්ගිරි පාර්ශ්වය	240,000.00
ශ්‍රී ලංකා අමරපුර මහා නිකාය	240,000.00
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය	240,000.00
ශ්‍රී ලංකා කෝට්ටේ කල්‍යාණි සාමග්‍රී සංඝ සභාව	240,000.00
එකතුව	1,200,000.00

අනු අංකය	දිස්ත්‍රික්කය	ලැබුනු ඉල්ලුම්පත් ගණන	සුදුසුකම් ලැබූ ගණන	නිවාස ඉදිකිරීම් කර ඇති ගණන	නිවාස ඉදිකිරීම් අවසන් ගණන	මූල්‍ය ප්‍රගතිය (රු.)
1	බදුල්ල	155	56	54	29	17,000
2	මොණරාගල	280	82	64	20	15,250
3	පොළොන්නරුව	184	77	77	38	27,705
4	අනුරාධපුරය	335	70	70	59	29,900
5	මාතර	155	90	85	36	26,305
6	මහනුවර	202	72	69	4	15,980
7	මාතලේ	151	58	58	1	12,300
8	කෑගල්ල	51	38	38	2	9,050
9	හම්බන්තොට	220	131	134	0	15,850
10	මුලතිව්	24	5	5	0	0,500
11	ත්‍රිකුණාමලය	16	10	10	0	1,400
12	වව්නියාව	14	7	7	0	0,700
	උප එකතුව	1787	696	661	189	171,940
13	කොළඹ	31	10			

14	ගම්පහ	81	40			
15	කළුතර	58	36			
16	ගාල්ල	115	69			
17	නුවරඑළිය	114	28			
18	අම්පාර	97	61			
19	කුරුණෑගල	155	55			
20	පුත්තලම	45	15			
21	රත්නපුර	216	87			
22	මඩකලපුව	1	0			
	උප එකතුව	913	401			
	මුළු එකතුව	2700	1097	661	189	171,940

01.5.6.9 සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලය

පාලි භාෂාවෙන් පමණක් පුස්කොළ පොත්වල ලියා තිබූ සම්පූර්ණ ත්‍රිපිටකගත පාලි ධර්මය ශ්‍රී සම්බුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ 2500 (භාවිත වර්ෂ 1956) සම්පූර්ණ වීම නිමිත්තෙන් බෞද්ධ ජනතාවගේ ඉල්ලීම පරිදි ග්‍රන්ථ සම්පාදක මණ්ඩලය මගින් සිංහල භාෂාවට පරිවර්තනය කර බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නමින් ග්‍රන්ථ 57 ක් ලෙස මුද්‍රණය කර ඇත.
එම පරිවර්තනයන් තව දුරටත් සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගැනීමට පහසු කරනු වස් වර්ෂ 1933 දී පළමු කී බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාවේ සිංහල පරිවර්තනය සරළ සිංහල භාෂාවට නැවත ලිවීමට තීරණය කර මහා නායක මහ තෙරුන් වහන්සේලාගෙන් සමන්විත **සංක්ෂිප්ත ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලය** පිහිටුවා ඇත.

01.5.6.10 මහානායක චාරිකාරාමය

මහා නායක ස්වාමීන් වහන්සේලා අගනුවර වැඩ කටයුතු සඳහා වැඩම කරන විට අවශ්ය විටකදී නවාතැන් ලබා ගැනීම සඳහා පහසුකම් සැපයීමට කොළඹ විජයාරාම මාවතේ මහානායක චාරිකාරාමය වෙන් කර තිබේ. මෙහි සංවර්ධන කටයුතු සඳහා ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 16.308 කි.

01.5.6.11 බෞද්ධ විශ්වකෝෂය යාවත්කාලීන කර අන්තර්ජාලයට එක් කිරීම

ජාත්‍යන්තර බෞද්ධ ප්‍රජාව වෙත බෞද්ධ දැනුම් පද්ධතිය පුළුල් කරනු වස් මෙය සිදු කරනු ලබයි.මේ වන විට සුචි වෙළුම සකස් කිරීමට අදාළව වෙළුම් 5 ක වචන පරිගණක යතුරු ලියනය කර අවසන්ව ඇත.සහකාර කර්තෘ බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇති අතර බඳවා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.

01.5.6.12 මිහිඳු නිවහන නිවාස ව්‍යාපෘතිය

හිත නිවන ගත නිවහන හිත නිවනක් නැති මා පියන් වෙත පිදෙන පූජාවක් යන තේමාව යටතේ 2020 වර්ෂයේ සිට ආරම්භ කරන ලද බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ දෙමව්පියන් සඳහා නිවසක් සාදා දීමේ වැඩපිළිවෙල යටතේ අයදුම්පත් නිර්දේශය මෙමගින් සිදු කරනු ලබයි.2021.12.31 වන විට අයදුම්පත් ක් දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත.

01.5.6.13 බෞද්ධ විශ්වකෝෂය යාවත්කාලීන කිරීම

බෞද්ධ විශ්වකෝෂය යනු බුදු දහමට අදාළ සියලු විෂයයන්ගේ ප්‍රධාන සංකල්ප විවරණය කරන මූලික බෞද්ධ ග්‍රන්ථයයි.

ඒ අනුව ථෙරවාදී, මහායාන හා වජ්‍රයාන යන සියලු බෞද්ධ සම්ප්‍රදායන්ට අයත් බෞද්ධ දාර්ශනික හා සංස්කෘතික වටිනාකමකින් යුතු පුද්ගල, ග්‍රන්ථ, සංකල්ප මෙන්ම පුරා විද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන ආදී සියල්ල පැහැදිලි කරමින් ලිපි රචනා කර ඇතුලත් කිරීම මෙම ග්‍රන්ථයේ සම්පාදන ක්‍රියාවලියයි. එය කලානුරූපීව යාවත්කාලීන කළයුතු අතර ලෝකයේ බුදු දහම සංවර්ධන විමට සමගාමීව අඛණ්ඩව සංවර්ධනය වියයුතු කෘතියකි. මෙහි මූලික අරමුණ වන්නේ බුදු දහමට අදාළව අධ්‍යයනයක හෝ පර්යේෂණයක නිරත වන ලෝකයේ ඕනෑම විද්‍යාර්ථයෙකුට අවශ්‍ය මූලික කරුණු පිළිබඳ අවබෝධයක් ලබාදීමයි.

මේ හැරුණු විට බුදු දහම පිළිබඳ උනන්දුවක් දක්වන විද්වතෙකුට බුදු දහමේ දැක්වෙන ඕනෑම සංකල්පයක් පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමට මෙම ග්‍රන්ථය ඉවහල් වේ. දැනට වෙළුම් ග්‍රන්ථ 08 ක් සම්පූර්ණ කර ඇති අතර ඉදිරියේ දී එය වෙළුම ග්‍රන්ථ 12 දක්වා වර්ධනය කිරීමට අපේක්ෂිතයි.

2500 වැනි සම්බුද්ධ ජයන්ති සැමරුමට සමගාමීව 1956 වර්ෂයේ දී එවකට පැවැති රජය විසින් බෞද්ධ විශ්ව කෝශය සම්පාදනය කිරීමේ කාර්යය ආරම්භ කර ඇත. වර්ෂ 1957 දී සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන කර්තෘ ලෙස මහාචාර්ය ජී.පී.මලලසේකර මහතා පත් කර ඇත. එලෙස වර්ධනය වූ බෞද්ධ විශ්වකෝෂය 2011 වර්ෂය වන විට ඉංග්‍රීසි භාෂාවෙන් වෙළුම් Viii කින් මුද්‍රණය කර අවසන් කර ඇත.

01.5.6.14 ශාසනික සංවර්ධන කටයුතු

සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතන සංවර්ධනය

ලංකාවේ බෞද්ධ සමාජය තුළ කාන්තා විමුක්තිය ළඟා කරනු වස් මහානායක ස්වාමීන් වහන්සේලාගේ අනුශාසනා මත පිහිටුවා ඇති සිල් මැණියන් සංවිධාන ශක්තිමත් කරනු වස් සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතන 03 ක් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබයි.1.**මූලටියන සිල්මාතා පුහුණු 1.අභ්‍යාස ආයතනය**
නේවාසිකාගාරය,දේශන ශාලාව,දාන ශාලාව පළමු අදියර හා බුදු මැදුර දෙවන අදියර නිම කර ඇති අතර බුදු මැදුරේ 3 වන අදියර ක්‍රියාත්මකයි.පැරණි ගොඩනැගිල්ලේ විදුලි පද්ධතිය සකස් කිරීමේ කටයුතු නිම කර ඇත.

2.කැළණිය සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනය
සුළු ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර ඇත.

3. අනුරාධපුර සිල්මාතා පුහුණු අභ්‍යාස ආයතනය
තිරය සහිත මල්ටි මීඩියා ප්‍රොජෙක්ටරය සවිකිරීම හා ආරක්ෂිත වැට ඉදිකිරීමද දාන ශාලාව ඉදිකිරීමේ පළමු අදියරද නිම කර ඇත.

අංකය	සිල්මාතා අභ්‍යාස ආයතනය	වැඩසටහන	2021 සඳහා ප්‍රතිපාදන ලැබීම් (රු.)	2021.12.31 දිනට ප්‍රතිපාදන නිදහස් කිරීම්	භෞතික ප්‍රගතිය
1.1	මූලටියන	නේවාසිකාගාරය,දේශන ශාලාව සහ දාන ශාලාව ඉදි කිරීම පළමු අදියර	මිලියන 08	2.272	100%
1.2		බුදු මැදුරේ දෙවන අදියර		2	100%
1.3		විදුලි පද්ධතිය සකස් කිරීම		0.45	100%
1.4		බුදු මැදුරේ 3 වන අදියර		1.5	100%
2.1	කැළණිය	සුළු ප්‍රතිසංස්කරණ කටයුතු		0.106	100%
3.1	අනුරාධපුර	දේශනශාලා උපකරණ මිල දී ගැනීම		0.099	100%
3.2		ආරක්ෂිත වැට ඉදි කිරීම		0.503	100%
3.3		දාන ශාලාව 1 අදියර		1.0	100%

01.5.6.15 බෞද්ධ කලාශිල්ප සහ බෞද්ධ ලේඛකාධාර ලබා දීම

බෞද්ධ සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂා කිරීම සඳහා පෙරහැරවල් හා උපහාර උත්සව සඳහා ගෙවීම්ද විද්වතුන්ට සිදු කරනු ලබන උපහාරයක් ලෙස ලේඛකාධාර ලබා දීම ගෙවීම් සිදු කරනු ලැබේ.2021 වර්ෂය සඳහා ගෙවීම් පහත පරිදි වේ.

බෞද්ධ කලා ශිල්ප සඳහා ගෙවීම්	පෙරහැර/උත්සව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	වෙන් කළ මුදල රු.
1.	ඓතිහාසික රයිගම්පුර ඔලබොඩුව නවම් මහා පෙරහැර මංගල්‍යය-ඔලබොඩුව ශ්‍රී ජයවර්ධනාරාම රජ මහා විහාරය,ඔලබොඩුව-හොරණ.	කළුතර	හොරණ	15,000.00
2.	දස පාරමිතා මහා පෙරහැර- අතුල දස්සන බෞද්ධමධ්‍යස්ථානය,බෞද්ධාලෝක මාවත,කොළඹ 07.	කොළඹ	තිඹිරිගස්යාය	15,000.00
3.	අරන්තලා ගුණ සමරු පිංකම	අම්පාර	මහඔය	75,000.00
4.	මිරිසවැටිය චෛත්‍ය ඉදිරිපිට සිදු කරන ලද සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනය	අනුරාධපුර	නැ.නු පළාත	477,000.00
5.	නාගොල්ලාගම ,ගලඅඹගස්වැව පුරාණ ටැම්පිට විහාරස්ථාන ඉදිරිපිටඅටවිසි බුද්ධ පූජාව සඳහා අටපිරිකර ලබා ගැනීම	කුරුණෑගල	මහව	45,000.00
6.	වීදාගම ඓතිහාසික සංස්කෘතික උත්සවය	කළුතර	බණ්ඩාරගම	15,000.00
7.	සඟමිත් හරසර නර්තන ශිල්පීන් සඳහා ගෙවීම්	කුරුණෑගල	කුරුණෑගල	12,000.00
			එකතුව	**654,000.00**

බෞද්ධ ලේඛකාධාර ලබා දීම

අනු අංකය	ග්‍රන්ථයේ නම	කර්තෘ	මිල දී ගැනීම සඳහා වැය කළ මුළු මුදල (රු.)
1.	ශ්‍රීලංකාව සඳහා භාවිත නාමයන්ගේ ඉතිහාසය	වජිර නාරම්පනාව	9,600.00
2.	ලෝවැඩ සඟරාව	සුසන්ත සේනාධිලංකාර	10,000.00
3.	English Through Buddhism	M.P.Senanayake	10,000.00
4.	දහමේ බලය පෙන්වන බණකතා	පූජ්‍ය යටදොළවත්තේ ජිනසිරි හිමි	9,960.00
5.	අභිනව ස්වර ස්ථාපන ගීත	සුදත් සමරසිංහ මහතා	10,000.00
6.	බුද්ධ ධර්මය	පූජ්‍ය රදලියද්දේ සීලානන්ද හිමි	4992.00
		එකතුව	**54,252.00**

01.5.6.16 බුදුපුත් මා පිය හරසර වැඩසටහන

ඉතිහාසය පුරා මේ රටේ ආරක්ෂාව සහ සමාජ සුභ සිද්ධිය වෙනුවෙන් පෙනී සිටිනුයේ භික්ෂූන් වහන්සේලා බවත් එම කාර්යය වෙනුවෙන් ශාසනයට තම දරුවන් භාර දුන් දෙමාපියන් සියලු දෙනාට රාජ්‍ය ගෞරව දැක්වීම සඳහා ‘‘බුදු පුත් මා පිය හරසර’’වැඩසටහන ක්‍රියාත්මක වේ.

01.5.6.17 හැදුනුම්පත් ලබා දීමේ වැඩසටහන

දහම් පාසල් උපකරණ ලබා දීම

අනු අංකය	දිස්ත්‍රික්කය/ප්‍රා.ලේ.කොට්ඨාසය	දහම්පාසලේ නම හා ලිපිනය	දළ ඇස්තමේන්තුගත මුදල (මිලි.)
1.	වව්නියාව දකුණ	ශ්‍රී සිද්ධාර්ථ ද.පා. ශ්‍රී සාලවන උද්‍යානාරාමය,බෝගස්වැව 02	0.3
2.	වව්නියාව දකුණ	ශ්‍රී රතනසාර ද.පා. මලයාපරත්තිකුලම	0.3
3.	වව්නියාව දකුණ	ශ්‍රී සඳගිරි ද.පා. ශ්‍රී සඳගිරි විහාරය,සැළලිහිණිලම,පිරප්පම්මඩුව	0.3
4.	වව්නියාව දකුණ	ශ්‍රී සද්ධර්මෝදය ද.පා. නන්දිමිත්‍රගම	0.3
5.	වව්නියාව දකුණ	ශ්‍රී පඤ්ඤානන්ද ද.පා. පුරාණගල්ලෙන් හාරය,මහකච්චකොඩිය.	0.3
6.	වව්නියාව දකුණ	ශ්‍රී ගුණරතන ද.පා. ශ්‍රී ස්වර්ණතිලකාරාමය,මාමඩුව	0.3
7.	වව්නියාව දකුණ	ශ්‍රී සද්ධාතිස්ස ද.පා.ශ්‍රී සුදර්මාරාමය,ඇටඹගස්කඩ	0.3
8.	වව්නියාව දකුණ	ශ්‍රී රතනසාර ද.පා.ශ්‍රී රතනසාර විහාරය,පුදුබුලාන්කුලම	0.3
9.	වව්නියාව දකුණ	ශ්‍රී සද්ධර්මානන්ද ද.පා. නෙඩුන්කුලම	0.3
10.	වව්නියාව දකුණ	ශ්‍රී සුමංගල ද.පා. ශ්‍රී නාමල් උයන විහාරය,නාමල්ගම	0.3
11.	වව්නියාව දකුණ	ශ්‍රී සාරිපුත්ත ද.පා. කුඩාකච්චකොඩිය	0.3

12.	වව්නියාව දකුණ	ශ්‍රී ධම්මරතන ද.පා. ශ්‍රී දළදා විහාරය,මඩුකන්ද	0.3
13.	වව්නියාව දකුණ	ශ්‍රී ගුණානන්ද ද.පා. ශ්‍රී බෝධිදක්ෂිණාරාමයවව්නියාව	0.3
14.	වව්නියාව දකුණ	ශ්‍රී සීලානන්ද ද.පා. ශ්‍රී ශෛලබිම්බාරාමය,ඉරට්ටපෙරියකුලම	0.3
15.	වව්නියාව දකුණ	මහා බෝධි ද.පා. කිරිගරුඩ විහාරය,කළුකුන්නම්මඩුව	0.3
16.	වව්නියාව දකුණ	ශ්‍රී බෝධි ද.පා. ශ්‍රී කළිගුදා විහාරය,අලගල්ල	0.3
17.	වව්නියාව දකුණ	ශ්‍රී කවිධජ ද.පා. ශ්‍රී චේතියගිරි පු.රජමහ විහාරය,අවරන්තුලාව	0.3
18.	වව්නියාව දකුණ	සිරි සුමන ද.පා. ශ්‍රී සුමනාරාමය,පෙරියඋළුක්කුලම	0.3
19.	වව්නියාව දකුණ	ශ්‍රී යසෝධරා ද.පා. කැළෑසියඹලෑව විහාරය,නේරියකුලම	0.3
20.	වව්නියාව දකුණ	සිරිගැමුණු ද.පා. සිරිගැමුණු විහාරය,මරදම්මඩුව	0.3
21.	වව්නියාව දකුණ	සිරි රතන ද.පා.ශ්‍රී බෝධිමළු විහාරය,කොක්ඵළිය	0.3
22.	වැලිඔය	ශ්‍රී ජිනරතන ද.පා. ශ්‍රී විජයාරාමය,නිකවැව වම ඇතාවැටුනවැව	0.3
23.	වැලිඔය	ශ්‍රී සිද්ධාර්ථ ද.පා. ශ්‍රී දේවගිරි විහාරය ඇහැටුගස්වැව,වැලිඔය	0.3
24.	වැලිඔය	ශ්‍රී ශෛලබිම්බාරාම ද.පා. ශ්‍රී ශෛලබිම්බාරාමය,නව මොණරවැව	0.3
25.	වැලිඔය	ශ්‍රී ධර්මාශෝක ද.පා. ශ්‍රී තිලකාරාමය,ජනකපුර	0.3

26.	වැලිඔය	ශ්‍රී ශාඛ්‍යපුත්‍ර සඳහම් සෙවන ද.පා. සපුමල් තැන්න ආරණ්‍ය සේනාසනය,සපුමල් තැන්න	0.3
27.	වැලිඔය	සීලමිත්‍ර ද.පා. ශ්‍රී උදුම්බරාරාමය,ඇතාවැටුනවැව	0.3
28.	වැලිඔය	ශ්‍රී මහානාම ද.පා. ශ්‍රී මයුරවාපි විහාරය,මොරවැව	0.3
29.	වැලිඔය	ශ්‍රී සුචරිත ද.පා. ශ්‍රී ධර්මප්‍රනීතාරාමය,කිරිඉබ්බන්වැව	0.3
30.	වැලිඔය	ශ්‍රී දම්මින්ද ද.පා. ගජබා විහාරය,ගජබාපුර	0.3
31.	වැලිඔය	ශ්‍රී බෝසෙවන ද.පා. ශ්‍රී ධර්මවර්ධනාරාමය,නිකවැව දකුණ	0.3
32.	වැලිඔය	ශ්‍රී කුමාරකස්සප දහම් පාසල,ශ්‍රී ධර්මවිසුද්ධාරාමය,කළ්‍යාණිපුර	0.3
33.	වැලිඔය	ශ්‍රී දුමින්ද ද.පා. ශ්‍රී ධර්මප්‍රිය වැලිමළු විහාරය,හැදලවැව	0.3
34.	වැලිඔය	ශ්‍රී ප්‍රඥාප්‍රදීප ද.පා.සුනිර්මලා ආරාමය,කළ්‍යාණපුර	0.3
35.	ත්‍රිකුණාමලය	අඩම්පනේ සම්බෝධි දහම් පාසල	0.3
36.	ත්‍රිකුණාමලය	කිව්ලකඩවල දේවරක්ඛිත දහම් පාසල	0.3
එකතුව			**11.1**

සසුනට තම දරුවන් පූජා කළ දෙමාපියන් සඳහා සේවා ලබා දීමේදී ප්‍රමුඛතා ලබා ගනු පිණිසත්,ඔවුනට ගෞරවයක් ලෙසත් හැදුනුම්පත් නිකුත් කිරීම සිදු කරනු ලැබේ.මෙහි සමාරම්භය 2021.11.14 දින රාජ්‍ය කයීන උත්සවයට සමගාමීව පඬුවස්නුවර කොළඹගම මියුගුණාරාම රාජ මහා විහාරස්ථානයේදී සිදු කරන ලදී.

01.5.6.18 සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම

රජයේ විශ්‍රාම වැටුපක් නොලබා දෙමාපියන් වෙනුවෙන් සමාජ ආරක්ෂණ අරමුදල හා එක්ව අවුරුදු 60 න් පසු ජීවිතාන්තය දක්වා විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට හැකි දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ආරම්භ කරනු ලැබේ.මෙම දායකත්ව මුදල පිරිකරක් ලෙස පූජා කිරීමට හැකියාව ලැබීමද මෙහි ඇති සුවිශේෂත්වයකි.

කොවිඩ් 19 ව්‍යසනකාරී තත්වය හමුවේ බලපෑමට ලක් වූ ආගමික සිද්ධස්ථාන සඳහා ආධාර ලබා දීම

2021 වර්ෂයේ කෝවිඩ් 19 ව්‍යසනකාරී තත්වයේදී දිස්ත්‍රික් 20 ක ප්‍රත්‍ය පහසුකම් සපයා ගැනීමට දුෂ්කර වූ විහාරස්ථාන 3371 ක් සඳහා රු.50000.00 ක වටිනාකමින් යුත් වියළි සලාක මළු 4488 ලබා දීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් සමගින් සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. (50000*4488=22,440,000)

අනු අංකය	දිස්ත්‍රික්කය	ලබා දුන් විහාරස්ථාන සංඛ්‍යාව	ලබා දුන් පාර්සල් සංඛ්‍යාව
01.	කොළඹ	136	277
02.	ගම්පහ	193	259
03.	කළුතර	217	269
04.	ගාල්ල	136	236
05.	මාතර	80	135
06.	හම්බන්තොට	206	339
07.	මහනුවර	428	522
08.	මාතලේ	30	51
09.	නුවරඑළිය	140	156
10.	කුරුණෑගල	243	309
11.	පුත්තලම	264	400
12.	අනුරාධපුරය	546	585
13.	පොළොන්නරුව	42	72
14.	බදුල්ල	34	60
15.	මොණරාගල	35	55
16.	රත්නපුර	239	271
17.	කෑගල්ල	155	163
18.	අම්පාර	187	261
19.	ත්‍රිකුණාමලය	46	54
20.	මඩකලපුව	14	14
	මුළු සංඛ්‍යාව	**3,371**	**4,488**

01.5.6.19 සාමණේර හා භික්ෂු පුහුණු වැඩසටහන්

සම්බුදු සසුනේ චිරස්ථිතිය හා අභිවෘද්ධිය වෙනුවෙන් නවක සාමණේර සහ උපසම්පන්න භික්ෂූන් වහන්සේලා ට අවශ්‍ය කරන්නා වූ දැනුම අවබෝධය භික්ෂීම කුඩා කල සිටම ලබා දීම අරමුණු කර ගනිමින් සිදු කරනු ලබයි.2021.02.06-2021.2.13 දක්වා දිනයන්හි ස්වාමීන් වහන්සේලා 87 නමක් සඳහා භික්ෂු පුහුණු වැඩසටහනක් හන්තාන බෞද්ධ මධ්‍යස්ථානයේදී ද 2021.11.20-2021.11.27 දක්වා දිනයන්හි ස්වාමීන් වහන්සේලා 56 නමක් සඳහා භික්ෂු පුහුණු වැඩසටහනක් පන්නිපිටිය දෙව්රම් වෙහෙරේදී පැවැත්විණි.

01.5.6.20 රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව ඌන සංවර්ධිත දහම්පාසැල් සංවර්ධනය

රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව ඌණ සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය සඳහා දහම් පාසල් ගොඩනැගිලි හා උපකරණ ආධාර ලබා දීම වාර්ෂිකව සිදු කෙරේ. ඒ අනුව 2021 වර්ෂය සඳහා උතුරු පළාත තුළ තෝරා ගත් දහම් පාසල් සඳහා ගොඩනැගිලි හා උපකරණ ආධාර ලබා දීම සිදු කර ඇත.

අනු අංකය	කාරණය	දහම් පාසල් සංඛ්‍යාව	නිදහස් කළ ප්‍රතිපාදන මි.ලි
01.	දහම් පාසල් ගොඩනැගිලි අලුත්වැඩියාව	වවුනියාව දකුණ- 06 වැලිඔය-13 ත්‍රිකුණාමලය-1	16.15
02.	දහම් පාසල් උපකරණ ලබා දීම	වවුනියාව දකුණ-22 වැලිඔය-13 ත්‍රිකුණාමලය-2	11.1
එකතුව		**57**	**27.25**

1.දහම්පාසැල් ගොඩනැගිලි සංවර්ධනය

උතුරු පළාතේ වවුනියාව ,මුලතිව් (වැලිඔය ප්‍රා.ලේ) දිස්ත්‍රික්ක සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල තෝරාගත් දහම් පාසල් 20ක් සඳහා මිලියන 16.15 ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර ඇත. ගොඩනැගිලි 16ක වැඩ අවසන්ව ඇත.

2.දහම්පාසැල් උපකරණ ලබා දීම

උතුරු පළාතේ වවුනියාව ,මුලතිව් (වැලිඔය ප්‍රා.ලේ) යන දිස්ත්‍රික්ක සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල තෝරාගත් දහම් පාසල් 37ක් සඳහා මිලියන 11.1ක ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර ඇත.භෞතික ප්‍රගතිය 100% ක් වේ.

2021 වර්ෂයේ සංවර්ධන අංශයේ ලියාපදිංචි කිරීම්

සිල්මෑණියන් වහන්සේලා ගණන- 271

උපැවිදි වූ (සිල්මෑණියන් වහන්සේලා)- 12

සිල්මාතා ආරාම ගණන- 18

විහාරස්ථ දායක සභා ගණන- 15

ආරාම දායක සභා ගණන- 3

අනු අංකය	දිස්ත්‍රික්කය/ප්‍රා.ලේ.කොට්ඨාසය	දහම්පාසලේ නම හා ලිපිනය	දළ ඇස්තමේන්තුගත මුදල (මිලි.)
1	වව්නියාව දකුණ	ශ්‍රී සිද්ධාර්ථ ද.පා. ශ්‍රී සාලවන උද්‍යානාරාමය,බෝගස්වැව 02	0.5
2	වව්නියාව දකුණ	ශ්‍රී සද්ධර්මොදය ද.පා.නන්දිමිත්‍රගම	0.5
3	වව්නියාව දකුණ	ශ්‍රී රතනසාර ද.පා.ශ්‍රී රතනසාර විහාරය,පුදුබුලාන්කුලම	0.1
4	වව්නියාව දකුණ	ශ්‍රී සාරිපුත්ත ද.පා. කුඩාකච්චකොඩිය	0.5
5	වව්නියාව දකුණ	ශ්‍රී කවිධජ ද.පා. ශ්‍රී චේතියගිරි පු.රජමහ විහාරය,අවරන්තුලාව	0.2
6	වව්නියාව දකුණ	ශ්‍රී යසෝධරා ද.පා. කැළැසියඹලැව විහාරය,නේරියකුලම	0.5
7	වැලිඔය	ශ්‍රී ජිනරතන ද.පා. ශ්‍රී විජයාරාමය,නිකවැව වම ඇතාවැටුනවැව	1
8	වැලිඔය	ශ්‍රී සිද්ධාර්ථ ද.පා. ශ්‍රී දේවගිරි විහාරය ඇහැටුගස්වැව,වැලිඔය	1
9	වැලිඔය	ශ්‍රී ශෛලබිම්බාරාම ද.පා. ශ්‍රී ශෛලබිම්බාරාමය,නව මොණරවැව	1
10	වැලිඔය	ශ්‍රී ධර්මාශෝක ද.පා. ශ්‍රී තිලකාරාමය,ජනකපුර	1
11	වැලිඔය	ශ්‍රී ශාඛ්‍යපුත්‍ර සඳහම් සෙවන ද.පා. සපුමල් තැන්න ආරණ්‍ය සේනාසනය,සපුමල් තැන්න	1
12	වැලිඔය	සීලමිත්‍ර ද.පා. ශ්‍රී උදුම්බරාරාමය,ඇතාවැටුනවැව	1
13	වැලිඔය	ශ්‍රී මහානාම ද.පා. ශ්‍රී මයුරවාපි විහාරය,මොරවැව	1
14	වැලිඔය	ශ්‍රී සුචරිත ද.පා. ශ්‍රී ධර්මප්‍රනීතාරාමය,කිරිඉබ්බන්වැව	1
15	වැලිඔය	ශ්‍රී දම්මින්ද ද.පා. ගජබා විහාරය,ගජබාපුර	1
16	වැලිඔය	ශ්‍රී බෝසෙවන ද.පා. ශ්‍රී ධර්මවර්ධනාරාමය,නිකවැව දකුණ	1
17	වැලිඔය	ශ්‍රී කුමාරකස්සප දහම් පාසල,ශ්‍රී ධර්මවිසුද්ධාරාමය,කළ්‍යාණිපුර	1
18	වැලිඔය	ශ්‍රී දුම්න්ද ද.පා. ශ්‍රී ධර්මප්‍රිය වැලිමළු විහාරය,හැදලවැව	1
19	වැලිඔය	ශ්‍රී ප්‍රඥාප්‍රදීප ද.පා.සුනිර්මලා ආරාමය,කළ්‍යාණපුර	1
20	ත්‍රිකුණාමලය	කිවිලකඩවල දේවරක්ඛිත දහම් පාසල	1
එකතුව			**16.15**

01.5.7 අභ්‍යන්තර විගණන අංශය

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ අංශවල හා ඊට අනුබද්ධිත ප්‍රාදේශීය කාර්යාලවල සහ විහාර දේවාලගම් පනතේ 4 (1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථානවල (විහාරස්ථාන සහ දේවාල) අවදානම් කළමනාකරණය, යහපාලනය හා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ස්වාධීන සහතිකයක් ලබා දීම හා උපදේශාත්මක කාර්යයක් සිදු කිරීම මෙන් ම එම සිද්ධස්ථාන විගණනයට ලක් කිරීම හා එම සිද්ධස්ථාන සඳහා මාර්ගෝපදේශ ලබාදීම මෙම අංශයෙන් සිදු කෙරේ.

ප්‍රධාන කාර්යයන්

01.දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි මුදල් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම අනුව එක් එක් කාර්තුව අවසානයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය හා ගිණුම් වාර්තාවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම.

02. ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාත්මක වන්නේදැයි සමාලෝචනය හා ඇගයීම.

03. වත්කම්, අලාභ වලින් ආරක්ෂා වනු ලබන්නේද පරීක්ෂාව.

04. ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ හා ආයතනික චක්‍රලේඛ වලට අනුකූලව ක්‍රියා කරන්නේදැයි පරීක්ෂාව.

05. ගිණුම් හා වෙනත් වාර්තාවල විශ්වසනීයත්වය නිශ්චය කිරීම, පවතින ගිණුම් ක්‍රමය මගින් නිවැරදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා අවශ්‍ය තොරතුරු සපයන්නේ දැයි සොයා බැලීම.

06. නාස්තිය, ඌණ උපයෝජනය, පමණ ඉක්මවා සිදුකරන වියදම් වැලැක්වීමට හා අනාවරණය කර ගැනීමට ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන ක්‍රම වල සාර්ථකභාවය ඇගයීම.
07. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කැඳවීම, පැවැත්වීම හා වාර්තාකරණය සිදු කිරීම.
08. කාර්ය මණ්ඩලයට පවරා දී ඇති වගකීම් ඉටුකිරීමෙහිලා ඔවුන්ගේ කාර්ය සාධනයෙහි ගුණාත්මකභාවය ඇගයීම.
09. 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තිය යටතේ පවතින සිද්ධස්ථාන වල විගණන කටයුතු සිදුකිරීම.
10. අවශ්‍ය අවස්ථාවල විශේෂ විමර්ශන පැවැත්වීම හා විමර්ශන වාර්තා ඉදිරිපත් කිරීම.
11. ප්‍රගති ඇගයීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාට සහාය වීම.

12. අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට සහය වීම.

2021 වර්ෂයේ ඉදිරිපත් කර ඇති විගණන වාර්තා

1. රුහුණු මහා කතරගම දේවාලය
2. මහියංගනය සුමන සමන් දේවාලය
3. සෙල්ල කතරගම මහසෙන් රජමහා විහාරය
4. තොටගමුව රන්පත් රජමහා විහාරය
5. දෙවිනුවර පරම විචිත්‍රාරාමය
6. ශ්‍රී සංඛපාල රජමහා විහාරය
7. තල්වත්ත ගංහාරාම රජමහා විහාරය
8. නවගමුව ශ්‍රී සුගතබිම්හාරාම රජමහා විහාරය
9. සීනිගම දෙවොල් මහා දේවාලය
10. වවුවර්පත් පරීක්ෂාව විගණන වාර්තාව
11. වැටුප් සම්බන්ධ විගණන වාර්තාව

01.5.8 මහනුවර ප්‍රාදේශිය කාර්යාලය

මහනුවර, මාතලේ, කෑගල්ල, නුවරඑලිය සහ බදුල්ල දිස්ත්‍රික්කයේ මුතියංගණ රජමහා විහාරය, මහියංගණ රජමහා විහාරය, මහියංගණ සමන් දේවාලය ඇතුළත් බෞද්ධ විහාර දේවාල ගම් ආඥා පනතේ 4(1) සහ 4(2) වගන්ති යටතේ පාලනය වන විහාරස්ථාන හා දේවාල ඇතුළු සිද්ධස්ථාන 92 ක් සහ අනෙකුත් සිද්ධස්ථාන 2580 ක ප්‍රමාණයක රාජකාරී කටයුතු ආවරණය කිරීම මෙම කාර්යාලය මගින් සිදු කරනු ලැබේ. තවද ප්‍රාදේශිය වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන විහාරස්ථාන සංවර්ධන කාර්යයන් , දහම් පාසල් ශිෂ්‍ය ප්‍රජාව හා ගුරුභවතුන් සම්බන්ධ කටයුතු මෙන්ම බෞද්ධ සමිති සමාගම් වලට අදාළ කටයුතු ද බෞද්ධ ප්‍රජාවගේ අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් විශාල ප්‍රමාණයක් ප්‍රාදේශිය වශයෙන් දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් මෙම කාර්යාලය මගින් ඉටු කරනු ලබයි.

ප්‍රධාන කාර්යයන්

- මාළිගාව, සතර මහා දේවාල හා පිටිසර දේවාල සඳහා දියවඩන නිළමේ සහ බස්නායක නිලමේවරු පත්කිරීමේ ඡන්ද කටයුතු සිදු කිරීම.
- පාලනය වන විහාරස්ථාන සහ දේවාල සඳහා භාරකරුවන් පත්කිරීම.
- භාරකාර ඇප මුදල් තැන්පත් කිරීම සහ නිදහස් කිරීම.
- සිද්ධස්ථාන වල දේපළ භාරකරුවන්ට භාරදීම.
- විහාර දේවාලවලට අයත් ඉඩම් බදු දීම.
- ප්‍රවේණි අයිතිවාසිකම් පවරා ගැනීම පිළිබඳ ලේඛන පවත්වාගෙන යාම.
- වාර්ෂික ගිණුම් වාර්තා ගෙන්වා ගැනීම, පරීක්ෂා කිරීම, මුදල් නිදහස් කිරීම.
- විහාරස්ථාන ආරවුල් සම්බන්ධ කටයුතු සිදු කිරීම.
- ශ්‍රී දළදා පෙරහැර, උපසම්පදා කටයුතු වලට සහාය වීම.
- දහම් පාසැල් උත්සව කටයුතු හා වෙනත් ආගමික අවස්ථාවන්ට සහභාගී වීම හා සහාය වීම.

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100% - 90%	**89% - 75%**	**74% - 50%**	**50%ට අඩු**
1. අයවැය වාර්තා				
2021 වර්ෂය තුළදී පළමු අර්ධ වාර්ෂික වාර්තා ලැබිම්	-	-	67%	-
2020 වර්ෂය තුළදී දෙවන අර්ධ වාර්ෂික වාර්තා ලැබිම්	-	-	-	41%
2021 වර්ෂය සඳහා අනුමාන අයවැය වාර්තා ලැබිම්	-	-	73%	
2021 වර්ෂය තුළදී පවත්වන ලද දැනුවත් කිරිමේ වැඩසටහන් ප්‍රමාණය (අපේක්ෂිත ප්‍රමාණය 10)	-		60%	
2021 වර්ෂය තුළදී සිදු කරන ලද ක්ෂේත්‍ර පරික්ෂණ ප්‍රමාණය (අපේක්ෂිත ප්‍රමාණය 24)		75%		
2021 වර්ෂය තුළදී සිදු කරන ලද කාර්යාල පරික්ෂණ ප්‍රමාණය (අපේක්ෂිත ප්‍රමාණය 50)		82%		

2021 වර්ෂය

1. නිකුත් කර ඇති බදු අයදුම්පත් සංඛ්‍යාව - 1020
2. අවසන් කර ඇති බදු ඔප්පු සංඛ්‍යාව - 232
3. තක්සේරු සඳහා යවා ඇති ලිපි ගණන - 155
4. ක්ෂේත්‍ර පරික්ෂණ ගණන - 18
5. කාර්යාල පරික්ෂණ ගණන - 41
6. විභාරාධිපති තහවුරු කිරිම් ලිපි - 24
7. භාරකරුවන් පත් කිරිමේ සංඛ්‍යාව - 09

01.5.9 රත්නපුර ප්‍රාදේශිය කාර්යාලය

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ රත්නපුර ප්‍රාදේශිය කාර්යාලය 1982/10/11 වන දින රත්නපුර මුවගම සිරිවිසුද්ධාරාම විහාරස්ථානයේදී සිව් දෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලයකින් යුක්තව ආරම්භ කර ඇත.ඉන් අනතුරුව වර්තමානයේ බෞද්ධ කටයුතු ප්‍රාදේශිය කාර්යාලය ස්ථාපිත කර ඇති රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය වෙත 1985/06/15 වන දින ගෙන ගොස් ඇත.වර්තමානය වන විට සහකාර කොමසාරිස්වරයෙකු ඇතුළු කාර්ය මණ්ඩලය දස දෙනෙකු සේවය කරනු ලබයි.

02.රත්නපුර, මොණරාගල,බදුල්ල යන දිස්ත්‍රික්ක වලට අදාලව 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනත ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.ඒ අනුව

පාලන බල ප්‍රදේශය

රත්නපුර,මොණරාගල,බදුල්ල යන දිස්ත්‍රික්කවල 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ (4) 1 සහ (4) 2 වගන්ති යටතේ පාලනය වන විහාරස්ථාන හා දේවාල ඇතුළත් වේ.

දිස්ත්‍රික්කය	4 (1) යටතේ පාලනය වන සිද්ධස්ථාන	4 (2) යටතේ පාලනය වන සිද්ධස්ථාන
රත්නපුර	20	559
මොණරාගල	11	370
බදුල්ල	08	394
එකතුව	**39**	**1323**

ප්‍රධාන කාර්යයන්

01. 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥා පනත යටතේ හා උප නීති යටතේ බෞද්ධ කටයතු කොමසාරිස් ජනරාල්වරයාට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට සහාය වීම

02. විශේෂයෙන්ම 4(1) පාලනයේ පවතින සිද්ධස්ථාන වල ඉඩම්, මූල්‍ය ,හා වත්කම් පාලනය සඳහා සහාය වීම හා ඒවා ආරක්ෂා කිරීමට විධිවිධාන සැලසීම

03. 4(2) යටතේ පාලනය වන සිද්ධස්ථාන සතු සාංඝික දේපල ආරක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු කිරීම

04. රත්නපුර, මොණරාගල, බදුල්ල දිස්ත්‍රික්කවල සිද්ධස්ථාන වල අභිවෘද්ධිය ඇති කිරීම හා පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම හා සහයෝගය ලබා දීම

05. සිද්ධස්ථාන සතු පෞරාණික අංගෝපාංගයන් ආරක්ෂා කරගනිමින් සංවර්ධනය කිරීම හා මතු පරපුර වෙනුවෙන් ඓතිහාසික උරුමයන් ආරක්ෂා කිරීමට අවශ්‍ය නිවැරදි මඟ පෙන්වීම ලබාදීම.

06. සිද්ධස්ථාන සතු දේපල නිසි කළමනාකාරීත්වයෙන් යුත්තව පරිහරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම හා ඒ සම්බන්ධව පසු විපරම් සිදු කිරීම

07. ආගමික හා සංස්කෘතික අංගයන් ආරක්ෂා කිරීමට මඟ පෙන්වීම හා සහයෝගය ලබා දීම

අප කාර්යාලය මඟින් 2021 වර්ෂය තුළ සිදු කර ඇති රාජකාරි කටයුතු සැකෙවින්

අනු අංකය	රාජකාරි කටයුතු	දිස්ත්‍රික්කය			
		රත්නපුර	බදුල්ල	මොණරාගල	මුළු ගණන
01	භාරකරුවන් පත් කිරීම (අදාල තොරතුරු විභාදේ. අංශයට යොමු කිරීම පමණක් සිදුකෙරේ.)	03	-	02	05
02	ඉඩම් බදු දීම	240	170	45	455
03	බදු මුදල් සංශෝධනය	70	510	08	588
04	දැව හෙළීම හා ප්‍රවාහනයට බලපත්‍ර නිකුත් කිරීම	90	-	88	178
05	අපවත් වී වදාළ ස්වාමීන් වහන්සේලා සතු බැංකු මුදල් නිදහස් කිරීම	25	10	03	38
06	පූජා ඔප්පු දීමට අනුමැතිය ලබා දීම	00	00	00	00
07	වන්දි මුදල් හා පොලී මුදල් නිදහස් කිරීම	02	02	01	05
08	විහාරස්ථාන සතු ඉඩම් හා වෙනත් ගැටලු නිරාකරණය කිරීම	202	278	29	509
09	මැණික් ගැරීමට නව බලපත්‍ර ලබා දීම නිර්දේශ කිරීම	182	07	28	217
10	මැණික් ගැරීමට දී ඇති බලපත්‍ර දීර්ඝ කිරීමට නිර්දේශ කිරීම	150	02	09	161

අනුමාන අයවැය වාර්තා සහ අර්ධ වාර්ෂික අයවැය වාර්තා වෙන් වෙන් වශයෙන් එක් එක් ශාඛාවලට බෙදා දී තිබූ අතර, ඒවා එක්රැස් කොට, වෙනම විෂයය පථයකට ගොනු කොට, පරිගණක දත්ත පද්ධතියට ඇතුළත් කිරීම සිදු කරන ලදී. එමගින් නියමිත කාලවකවානු වලට අනුමාන හා අර්ධ වාර්ෂික වාර්තා නොඑවන සහ ප්‍රමාද වී එවනු ලබන භාරකාර ස්වාමීන් වහන්සේලා, භාරකරුවන් හා බස්නායක නිලමේවරුන් දැනුවත් කිරීම පෙරට වඩා කාර්ෂයක්ෂම වී ඇති අතර, කාර්යාලයේ කටයුතු අප්‍රමාදව සිදු කිරීමට ද හැකි වී ඇත.

.මෙම කාර්යාලය මඟින් සිදු කරන ක්ෂේත්‍ර පරීක්ෂණ හා කාර්යාල පරීක්ෂණ මඟින් සිද්ධස්ථාන වල පවතින ආරවුල් සඳහා විසඳුම් ලබා දීමට පියවර ගෙන ඇත. බදු කරුවන් හා භාරකරුවන් සමඟ සාකච්ඡා කර බදු මුදල් අයකර ගැනීම සඳහා විශේෂ පියවරයන් රැසක් ගෙන ඇත.විශේෂයෙන්ම බදුල්ල පත්තිණි දේවාලය, බදුල්ල රඹුක්පොත රජ මහා විහාරය,කටුගහ ගල්ගේ පුරාණ විහාරය සහ ඇඹිලිපිටිය කාවන්තිස්ස රජ මහා විහාරයට අයත් ඉඩම්වල අනවසර පදිංචිකරුවන් හට හා නව බදු කරුවන් හට දීර්ඝකාලීන බදු ඔප්පු ලබා දීමට අදාල ක්‍රියාමාර්ග මෙම වර්ෂය තුළ ආරම්භ කර ඇති අතර, බදුල්ල පත්තිනි දේවාලයේ ලුණුගල සහ බදුල්ල රඹුක්පොත විහාරයේ කලාලියැද්ද බදුකරුවන් බොහොමයකට මේ වන විට බදු ඔප්පු නිකුත් කර අවසන් වී ඇත. බදු ගෙවීම් පැහැර හැරීම්, නීත්‍යානුකූල බදු නොගෙවීම් සහ බදු මුදල් අභියාචනා ගැනද විශේෂ අවධානය යොමු කර කටයුතු කර ඇත.

පෙර වර්ෂ වල දී බදුකරුවන් බදු මුදල් සංශෝධනය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන අභියාචනා වල දී ඒ අනුව සලකා බලා බදු මුදල් අඩු කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කරන ලද මුත්, 2020 වර්ෂයේ දී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත බදු මුදල අනුවම බදු මුදල තීරණය කිරීමට හැකිතාක් උත්සාහ කිරීමෙන් සිද්ධස්ථාන වල ආදායම වැඩි කිරීමට රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය මඟින් කටයුතු කර ඇත. දීර්ඝකාලීන බදුකාලය ඇපයට තබා ණය මුදලක් ලබා ගැනීමට අවස්ථාව සලසා දීම තුළින් බදු කරුවන් මේ වන විට බදු ඔප්පු ලබා ගැනීමට වැඩි නැඹුරුවක් දක්වා ඇත. ණය ලබා ගැනීම තුළින් බදුකරුවන් ද ආර්ථික වශයෙන් දියුණු තත්වයකට පත් වී ඇත.

05. සිද්ධස්ථාන ඉඩම් වලට අදාලව තීරණ ගැනීම සඳහා වෙනත් ආයතන වලින් කැඳවී කරන ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා මෙම වර්ෂයේ දී අප නිලධාරීන් සහභාගී වී ගැටළු නිරාකරණය කිරීම සඳහා එම ආයතන වලට සහය ලබා දී ඇත.

06. බදු ලබා දීමේ ක්‍රියාවලිය තුළ මොණරාගල දිස්ත්‍රික්කයේ වත්තේගම රජ මහා විහාරයට අයත් ඉඩම් දීර්ඝකාලීන බදු ලබා දීම යටතේ වත්තේගම ප්ලාන්ටේෂන් ආයතනය වෙත අක්.2138 ක් බදු ලබා දීමට කටයුතු කර ඇත. ඒ තුළින් වර්තමානයේ ප්‍රදේශයේ ජනතාවට රැකියා අවස්ථා රාශියක් උත්පාදනය වී ඇත. එම ව්‍යාපෘතිය සඳහා විශාල ජනතා විරෝධයක් මුල් කාලීනව පැවති අතර, ඒ සඳහා පැවති සාකච්ඡා සඳහා සහභාගී වී නිසි කළමනාකාරිත්වයෙන් යුක්තව ගැටළුව විසඳීම නිසා, වර්තමානය වන විට එම ප්‍රදේශය ආර්ථික ප්‍රබෝදයකට ලක් වී ඇත. මෙතුළින් අප දෙපාර්තමේන්තුව ද රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක වීමේ අවස්තාවක් උදාකර ගෙන ඇත .එමෙන්ම, වත්තේගම රජ මහා විහාරයේ ඉඩම් දීර්ඝකාලීනව බදු ලබා ගෙන ඇති මැලිබන් ආයතනය ද පරිසර හිතකාමී වගාවන් ව්‍යාප්ත කර නිසි පරිදි ප්‍රයෝජනයට නොගෙන තිබූ ඉඩම් නිසි කළමනාකාරිත්වයක් යටතේ වගා කිරීම තුළින් දුෂ්කර ප්‍රදේශයක් වන වත්තේගම ප්‍රදේශය නව පිබිදීමකතට ලක් වී ඇත. එතුළින් මංමාවත් ආදී යටිතල පහසුකම් මෙන්ම ආර්ථිකමය වශයෙන් එහි ජනතාව ශක්තිමත් වීමට ද අවකාශ ලැබී ඇත.

මෙම කාර්යාල බල ප්‍රදේශයෙන් පාලනය වන සිද්ධස්ථාන වල සිදුවන විවිධ අක්‍රමිකතා සම්බන්ධයෙන් මහජනතාව විසින් සිදුකරන විවිධ පැමිණිළි වලට අදාලව රජයේ අනෙකුත් ආයතන මඟින් සිදුකරන පරීක්ෂණ වල දී මෙම කාර්යාලය මඟින් සම්පූර්ණ දායකත්වය ලබා දී ඇත. එම අක්‍රමිකතා මහහරවා ගැනීම සඳහා කටයුතු කිරීම හා විධිවිධාන සැළසීම.

එමෙන්ම, විහාර දේවාලගම් පනතේ 4(1) යටතේ පාලනය වන සපරගමු මහ සමන් දේවාලය, රුහුණු මහා කතරගම දේවාලය, කිරිවෙහෙර රජ මහා විහාරය, සෙල්ල කතරගම මහසෙන් රජ මහා විහාරය යන සිද්ධස්ථාන වල වර්ෂයක් තුළ දී අවස්ථා කීපයක දීම පඩුරු ගණනය කිරීම හා බැංකු ගත කිරීම අධීක්ෂණය කිරීම මෙම කාර්යාලයේ කාර්යය මණ්ඩලය විසින් සිදු කරන ලදී.

මීට අමතර වශයෙන් සංඛපාල රජ මහා විහාරය, බොල්තුඹේ මහ සමන් දේවාලය, සොරගුණේ කුඩා කතරතගම දේවාලය, අම්මඩුව කුඩා කතරගම දේවාලය, කොටබෝව කුඩා කතරගම දේවාලය, අලුත් නුවර කුඩා කතරගම දේවාලය යන සිද්ධස්ථාන වල වාර්ෂිකව පැවැත්වෙන පෙරහරින් පසු එක් වරක් පමණක් පඩුරු මුදල් ගණනය කිරීම, අධීක්ෂණය කිරීම සිදු කරනු ලැබේ.රුහුණු මහා කතරගම දේවාලයේ පෙරහර රජකාරී කටයුතු අධීක්ෂණය ද මීට අමතරව සිදු කරනු ලබයි. එසේම අලුත් නුවර කුඩා කතරගම දේවාලයේ ,

සපරගමු මහ සමන් දේවාලයේ පෙරහරට සමගාමීව පැවැත්වෙන කඩබිම් වෙන්දේසි සඳහා අධීක්ෂණය ලබා දී ඇත. මීට අමතර වශයෙන් සපරගමුව මහ සමන් දේවාලයේ පඩුරු ගණනය කිරීම හා බැංකුගත කිරීම අධීක්ෂණයට සමගාමීව මැණික් ආදායම හා විදුලි ආධාර රිසිට්පත් ආදායම ගණනය කිරීම සිදු කරන අතර, ඉදිරියටත් එලෙස එම කාර්යයන් ක්‍රියාත්මකව පවතී.

රටේ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වුවද කාර්යාලය මඟින් සලසන සේවාවන් හා අධීක්ෂණ කටයුතු නොපිරිහෙලා ඉටු කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබුණි.එමෙනන්ම වසංගත තත්ත්වයට සාර්ථකව මුහුණ දීමට කාර්යාලයේ සෞඛ්‍යා ආරක්ෂිත වැඩපිළිවෙලක් ආරම්භකර තිබුණි. ඒ අනුව කාර්ය මණ්ඩලය සියලු දෙනාගේම සෞඛ්‍ය ආරක්ෂාව හා මහජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව වෙනුවෙන්ද යුතුකම් ඉටු කිරීමට හැකියාව ලැබුණි.

ඉදිරි ඉලක්ක

- 2021 වර්ෂයේ ඉටු කළ කාර්යයන් වල අඩු පාඩු මග හරවා ගනිමින් ඒවා තව දුරටත් වැඩි දියුණු කිරීම.
- වඩාත් ඵලදායී සේවයක් ලබාදීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම
- කාර්යාල කටයුතු කාර්යක්ෂම කිරීම සදහා පරිගණක දත්ත පද්ධතියක් සකස් කිරීම
- කාර්යය මණ්ඩලය සුභදතාවය වර්ධනය හා දැනුම, ආකල්ප වර්ධනය පුහුණු වැඩසටහන් පැවැත්වීම
- විහාරාධිපති ස්වාමීන් වහන්සේලා හා භාරකරවරුන් දැනුවත් කිරීම සඳහා වැඩසටහනක් සංවිධානය කිරීම
- සිද්ධස්ථාන සතු වත්කම් හා දේපල හඳුනා ගැනීම සඳහා කටයුතු කිරීම

ඉහත සඳහන් කාර්යයන් 2021 වර්ෂයේදී මෙම කාර්යාලය මඟින් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටුකිරීමට අපේක්ෂිත අතර ඒ සඳහා කාර්යාලීය පරිසරය සකස්කර ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම හා නිලධාරීන්ගේ ආකල්ප වර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම ඉතාම අත්‍යවශ්‍ය වේ. මෙම කාර්යාලය මඟින් සියළුම සේවාලාභීන් වෙත වඩාත් කාර්යක්ෂම හා සඵලදායී සේවයක් ඉටුකිරීම අපගේ අරමුණ වන අතර ඒ තුළින් යහපත් රාජ්‍ය සේවයක් ඉටුවනු ඇත.

01.5.9 කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය

පාලන බල ප්‍රදේශය - කුරුණෑගල දිස්ත්‍රික්කයේ සියළුම සිද්ධස්ථාන

දිස්ත්‍රික්කය	4(1) යටතේ පාලනය වන විහාරස්ථාන	4(1) යටතේ පාලනය වන දේවාල	4(1) යටතේ පාලනය නොවන විහාරස්ථාන
කුරුණෑගල	45	6	1580

ප්‍රධාන කාර්යයන්

01. කුරුණෑගල දිස්ත්‍රික්කයේ විහාර දේවාලගම් ආඥා පනතට අයත් විහාරස්ථාන හා දේවාල ඉඩම් සංගණනය (විහාරස්ථාන හදුනා ගැනීම ක්ෂේත්‍ර පරීක්ෂා)

02. විහාර දේවාලගම් ආඥා පනතට අයත් විහාරස්ථාන හා දේවාලවල භාරකරුවන් දැනුවත් කිරීම.

- විහාරස්ථාන හා දේවාලවල දැනට පැන නැගී ඇති ගැටළු හදුනා ගැනීම හා ඒවාට කඩිනම් විසඳුම් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.
- බදු ලබා දීමට හැකි මේ වනවිටත් මුඩු බිම් වශයෙන් ඇති ඉඩම් සංවර්ධන කිරීම සඳහා බදු ලබා දීමට අවශ්‍ය කටයුතු කිරීම.

03. අර්ධ වාර්ෂික අය වැය හා අනුමාන අයවැය ඇස්තමේන්තු ලබා ගැනීම

04. 4-1 වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථානවල වත්කම් ලේඛන සකස් කිරීමට කටයුතු කිරීම.

05. විහාර දේවාලවලට අයත් ඉඩම් බදු දීම.

06. සිද්ධස්ථාන ඉඩම්වල ගස් හෙලීම් සඳහා අනුමැතිය ලබාදීම.

07. විහාරස්ථාන ආරවුල් සම්බන්ධ කටයුතු සිදු කිරීම.

08. අපවත් වූ ස්වාමීන් වහන්සේලාගේ දේපල සම්බන්ධ අවශ්‍ය රාජකාරි කටයුතු සිදු කිරීම.බැංකු ගිණුම්වල මුදල් නිදහස් කිරීම.

09. භාරකාර දෙපාර්තමේන්තුවේ ඇති මුදල් සංවර්ධන කාර්යයන් සඳහා නිදහස් කිරීම.

10. සාමණේර උපසම්පදා සහතික නිකුත් කිරීම.

11. විහාරස්ථාන ඉඩම්වල පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික කටයුතු සඳහා අනුමැතිය ලබා දීම.

12. රජයේ සංවර්ධන කාර්යයන් සඳහා විහාරස්ථාන ඉඩම් ලබා ගැනීමට අනුමැතිය ලබා දීම

13. දහම් පාසල් උත්සව කටයුතු හා වෙනත් ආගමික අවස්ථාවන්ට සහභාගි වීම හා සහා

අනු අංකය	කරන ලද රාජකාරි	ගණන (මුදල නිදහස් කිරීමක් නම් මුදල සඳහන් කරන්න)	
		ආරම්භ කර ඇති ගොණු සංඛ්‍යාව	වැඩ අවසන් කර ඇති ගොණු සංඛ්‍යාව
01	නව සිද්ධස්ථාන සම්බන්ධයෙන් ගැටළු නිරාකරණය කිරීම	06	04
02	දේපල අයිතිය පිළිබඳ ලිපි ලබා දීම	08	08
03	පදිංචිය පිළිබඳ තහවුරු කර ලිපි ලබා දීම	16	16
04	සිද්ධස්ථාන සතු දේපල බදු දීම	319	23
05	බදු යාවත්කාලීන කිරීම්		
06	අනුමාන අයවැය වාර්තා ගෙන්වා ගැනීම්	50	24
07	අර්ධ වාර්ෂික අයවැය ලේඛන ගෙන්වා ගැනීම	50	24
09	වත්කම් ලේඛන සකස් කිරීම		
10	විහාර ගිණුම් මඟින් මුදල් නිදහස් කිරීම	01	
11	වන්දි මුදල් නිදහස් කිරීම	07	06
12	වන්දි මුදල් භාර අරමුදල් මඟින් පොලී මුදල් නිදහස් කිරීම	01	
13	අපවත් වූ ස්වාමීන් වහන්සේලාගේ ගිණුම් සම්බන්ධ රජකාරි	11	08
14	සිද්ධස්ථාන ඉඩම්වල සතු ගස් හෙලීමට අනුමැතිය ලබා දීම	11	11
15	සිද්ධස්ථාන සතු රජයේ සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගැනීමට අනුමැතිය ලබා දීම		
16	විවිධ පාර්ෂවයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටළු සහ චෝදනා සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම	06	05
17	වෙනත් ආයතන මඟින් පවත්වනු ලබන සාකච්ඡා සහ රැස්වීම් සඳහා සහභාගි වීම		
18	සාමණේර / උපසම්පදා සහතික නිකුත් කිරීම, මුදල් ගිණුම්ගත කිරීම හා මාසික වාර්තා යැවීම.	නි.ක. සහතික 265	රු.2650.00
19	විහාරස්ථාන නාම ලේඛනය හා දහම් පාසල් ගුරු සිසු තොරතුරු ඇතුලත් කිරීම හා යාවත්කාලීන කිරීම සහාය ලබාදීම	දහම් පාසල් ගුරු විභාගය සඳහා ගුරුවභවතුන්ගේ තොරතුරු ලේඛන ගත කිරීම	
20	බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවෙන් පවත්වනු ලබන විශේෂ වැඩසටහන්වල රාජකාරි කටයුතු		
21	පඬුරු මුදල් රාජකාරි අවස්ථා		

02 පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 2021 දී ක්‍රියාත්මක වූ ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය

අනු අංකය	වැඩසටහන/ව්‍යාපෘතිය	**2021** අයවැය මඟින් ප්‍රතිපාදන ලැබීම් රු.(මි.ලි)	භෞතික ප්‍රගතිය (%)	මූල්‍ය ප්‍රගතිය **2021.12.31** දිනට **(රු.මි.)**	විශේෂිත කරුණු
1.	ජාතික වෙසක් උත්සවය	2.20	-	-	කොවිඩ් වසංගත තත්ත්වය
2.	ජාතික සිල්මාතා පුහුණු වැඩසටහන	8.00	100%	8.00	-
3.	ජාතික නිදහස් පිරිත	1.00	100%	1.5	-
4.	දහම් පාසැල් පෙළ පොත් මුද්‍රණය	210.00	100%	100	-
5.	ගුරුවරුන් සඳහා නිළ ඇඳුම් සැපයීම	212.00	100%	212.10	-
6.	ගුරුවරුන් සඳහා දීමනා	570.14	100%	544.80	-
7.	ගුරු සහතික පත්‍ර	0.50	-		කොවිඩ් වසංගත තත්ත්වය
8.	සිසු නිපුණතා වැසසටහන	30.00	-		කොවිඩ් වසංගත තත්ත්වය
9.	දහම් පාසැල් ශ්‍රේණි විභාග	35.00	-		කොවිඩ් වසංගත තත්ත්වය
10.	දහම් සරසවි හා උසස් ඩිප්ලෝමාව	12.00	-		කොවිඩ් වසංගත තත්ත්වය
11.	බෞද්ධ විශ්වකෝෂ	.05	-		කොවිඩ් වසංගත තත්ත්වය
12.	ත්‍රිපිටකය	3.00	-		කොවිඩ් වසංගත තත්ත්වය
13.	ගුරු පුහුණු	5.00	-		කොවිඩ් වසංගත තත්ත්වය

1.2 ඉදිරි ඉලක්ක

2022 දී ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත ව්‍යාපෘති හා වැඩසටහන්

අනු අංකය	වැඩසටහන	2022 ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත ප්‍රතිපාදන/ඉලක්ක රු.(මී.ලී)	2022 ඉදිරි දැක්මට අනුව ඉලක්ක
1.	ජාතික වෙසක් උත්සවය	5.5	
2.	ජාතික සිල්මාතා පුහුණු වැඩසටහන		100%
3.	සංඝමිත්තා පෙරහැර		
4.	ජාතික නිදහස් පිරිත	1.2	100%
5.	දහම් පාසැල් පෙල පොත් මුද්‍රණය	-	100%
6.	ගුරුවරුන් සඳහා නිල ඇදුම් සැපයිම	520.00	100%
7.	ගුරුවරුන් සඳහා දීමනා		
8.	ගුරු සහතික පත්‍ර	3.50	100%
9.	සිසු නිපුණතා වැසසටහන	28.00	100%
10.	දහම් පාසැල් ශ්‍රේණි විභාග	22.00	100%
11.	දහම් සරසවි හා උසස් ඩිප්ලෝමාව	1.00	100%
12.	බෞද්ධ විශ්වකෝෂ	5.1	100%
13.	ත්‍රිපිටකය	3	100%
14.	ගුරු පුහුණු	1.00	100%

3.පරිච්ඡේදය

2021 වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය



ඒසීඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය 2021 රු.	තත්‍ය නැවත ගලපන ලද 2020 රු.	
	ආදායම් ලැබීම්		-	-	
	ආදායම් බදු	1	-	-	
	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
	ආදායම් නොවන ලැබීම්		-	-	
	භාණ්ඩාගාර අග්‍රිම		605,003,000	499,920,000	ඒසීඒ-3
	තැන්පතු		4,780,185	4,484,187	ඒසීඒ-4
	අත්තිකාරම් ගිණුම්		24,116,866	15,710,077	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්				
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		633,900,051	520,114,264	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		633,900,051	520,114,264	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		1,071,988	20	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		632,828,062	520,114,244	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
466,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	446,383,447	441,067,611	
119,300,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	87,085,511	75,548,692	ඒසීඒ-2(ii)
874,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	864,712,077	668,979,470	
	පොළී ගෙවීම්	8			
	වෙනත් පුනරාවර්තන වියදම්	9			
1,459,300,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		1,398,181,035	1,185,595,773	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
4,100,000	වැඩිදියුණු කිරීම්	10	895,572	446,539	
6,100,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	14,050,961	6,516,544	
67,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	52,283,745	43,319,135	ඒසීඒ-2(ii)
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13			
1,500,000	හැකියා වර්ධනය	14	780,484	694,599	
	වෙනත් මූලධන වියදම්	15			
78,700,000	**මුළු මූලධන වියදම් (උ)**		68,010,762	50,976,817	
	තැන්පතු ගෙවීම්		5,148,553	7,755,550	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		28,045,173	23,786,871	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		0	0	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		33,193,726	31,542,421	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,499,385,523	1,268,115,011	
1.538,000,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ=(ඉ-එ)**		-866,557,461	-748,000,767	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		-866,557,461	-748,000,767	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		1,071,988	20	ඒසීඒ-3
			0	0	

ප්‍රදානයන් ලැබීම	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඇ)	-	-

අඩුකළා : මුදල් වැය කිරීම

ඒසිඒ-8

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	179,675,989	159,624,716
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	70,837,104	64,926,556
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	0	0
මුළු වත්කම්		250,513,093	224,551,272
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		70,772,104	64,493,188
දේපළ පිරියත හා උපකරණ සංචිතය		179,675,989	159,624,716
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ප්‍රංශ වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	65,000	433,368
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	0	0
මුළු වගකීම්		250,513,093	224,551,272

පිටු අංක 4 සිට 57 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 58 සිට 71 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචනය සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ණෙන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොම්පැනීස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 24.02.2022	දිනය : 23/02/22	දිනය : 2022-02-22

සුනන්ද කාරියප්පෙරුම
බෞද්ධ කටයුතු කොමිසාරිස් ජනරාල්
බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
දහම්පාය, අංක 135,
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

එල්. ඩී. පී. ප්‍රසාන්ත
ප්‍රධාන ගණකාධිකාරි
බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
"දහම් පාය", අංක 135,
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 7.

දේශබන්ධු මහාචාර්ය කමිල ගුණවර්ධන
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික
කටයුතු අමාත්‍යාංශය
අංක 135, "දහම්පාය",
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2021 රු.	කළා නැවත ඉදිපත් කළ 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	25,445,172	25,165,568
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	605,003,000	499,920,000
අත්තිකාරම් අයකර ගැනීම්	24,107,249	17,460,919
තැන්පතු ලැබීම්	4,780,185	4,484,187
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	659,335,606	547,030,674
අඩුකළා : මුදල් වැය කිරීම්		
සුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	488,743,634	485,527,809
සහනාධාර සහ මාරුකිරීම්	115,387,575	15,992,608
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	498,989	4,641,359
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	1,071,988	20
අත්තිකාරම් ගෙවීම්	28,045,173	23,786,871
තැන්පතු ගෙවීම්	5,148,553	7,755,550
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	638,895,912	537,704,217
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	20,439,694	9,326,457
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	20,439,694	9,326,457
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	20,439,694	9,326,457
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(20,439,694)	(9,326,457)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ) (ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඒඒ/සි/ඩීබීඒ/02/2021/03 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 ජූනි 07 දින

බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්
බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් 2021 දෙසැම්බර් 31 දින වන විට වෙනත් ආයතන වෙතින් පවරාගෙන තිබුණු අංක KI 4781, KA 7159 හා PA 2741 දරන වාහන 03 හි වටිනාකම (තක්සේරු කර නැත) මූල්‍ය නොවන වත්කම් තුලට ඇතුළත් නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් සඳහන්ව තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතුව පැවති අංක LI 4418 දරන ලොරි රථය 2021 සැප්තැම්බර් 02 දින අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත පවරා දී ඇතත් මෙතෙක් මූල්‍ය නොවන වත්කම්වලින් ඉවත් නොකිරීම හේතුවෙන් එහි වටිනාකම වූ රු.1,176,000 ක ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් වැඩියෙන් සඳහන්ව තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, ඇස්තමේන්තු සකස් කිරීමේදී හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කළ යුතු වුවත් වැය විෂයයන් 28 කට අදාල මූලික සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර විචලතාවය සියයට 11 සිට සියයට 241 දක්වා පරාසයක පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තුව සඳහා වූ රු.1,566,363,626 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.100,171,828 ක ප්‍රතිපාදන හෙවත් සියයට 6.4 ක් ඉතිරි කර තිබුණි. එම ඉතිරිකිරීම්වලින් පුනරාවර්තන වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.201,001 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරිකර තිබුණු අතර පුනරාවර්තන වැය විෂයයන් 09 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක් සඳහා සලසාගෙන තිබුණු රු.69,413,947 ක ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 76 දක්වා වූ පරාසයකට අයත් රු.28,543,744 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

(ඇ) ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් මු.රෙ 66 ය්ටතේ 201-2-10-2205 වැය විෂයය සඳහා මාරු කර තිබූ රු.280,000 ක ප්‍රතිපාදන මුදලම වියදම් නොකර ඉතිරි කර තිබුණි.

2.2 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නීති, රීති රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ	
(i) මුදල් රෙගුලාසි 1646	වාහන සඳහා දෛනික ධාවන සටහන් සෑම මාසයක් අවසන් වී එළැඹෙන මාසයේ 15 දිනට ප්‍රථම විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 1647	දෙපාර්තමේන්තුව සතු වාහන 4 ක් සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

පිටුව 4 | 7

(ආ) 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.3 වගන්තිය	ඉන්ධන භාවිතයේ අභිතකර වෙනසක් ඇත්නම් එය හඳුනාගැනීම සඳහා චක්‍රලේඛයෙහි ඇමුණුම 01 හි දක්වා ඇති ප්‍රවාහන සේවා සටහන මාසිකව සම්පූර්ණ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඇ) 2015 ජූලි 14 දිනැති අංක 4/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය	වෙළඳපොල තුළ ක්‍රියාත්මක ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි රජය සතු ආයතන වෙතින් මිල ගණන් කැඳවීම තුළින් රක්ෂණ ආවරණයක් සලසා ගත යුතු වුවත් මිල ගණන් කැඳවීමේදී රජය සතු ආයතනයක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා ජාතික රක්ෂණහාර අරමුදලෙන් මිල ගණන් කැඳවා තිබුණද පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් ආයතනයෙන් මිලගණන් කැඳවීමට කටයුතු කර නොතිබුණි.

2.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් 2021 දෙසැම්බර් 31 දිනට අය විය යුතු වර්ෂ 02 සිට වර්ෂ 03 දක්වා වූ කාල පාරාසයකට අයත් එකතුව රු.262,686 ක ණය ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණු අතර 2019 සැප්තැම්බර් 01 දින මිය ගිය නිලධාරියෙකුගේ රු.14,330 ක ණය ශේෂ අයකර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම.

කැලණිය ඊරියවැටිය දසසිල් මාතා පුහුණු ආයතනය ඉදිකිරීම, සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) රු. මිලියන 74.96 ක් වැය කර ඉදි කර තිබුණු දසසිල් මාතා මූලස්ථානය හා පුහුණු ආයතනයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර දෙපාර්තමේන්තුව වෙත භාරදී වර්ෂ 6 කට වැඩි කාලයක් ගතවී තිබුණද, අපේක්ෂිත පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

(ii) ඉහත (i) ඡේදයේ සඳහන් ආයතනය ඉදිකරන ලද ඉඩම් දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට 2012 වර්ෂයේදී පූජ්‍ය වැලමිටියාවේ කුසලධම්ම නායක ස්වාමීන් වහන්සේගේ කැමැත්ත ප්‍රාදේශිය ලේකම්වරයා වෙත දැනුම් දී තිබූ අතර වර්ෂ 09 කට වැඩි කාලයක් ගත වී තිබුණද මෙතෙක් එම අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නීතිමය අයිතිය තහවුරු කරගෙන නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) මහා නායක වාරිකාරාමය ප්‍රතිසංස්කරණය

(i) රු.16,380,626 ක මුදලක් වැය කරමින්, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන මහා නායක වාරිකාරාමය ප්‍රතිසංස්කරණය සිදු කරන පාර්ශවය වන නාවික හමුදාව සමඟ, බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හෝ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලිඛිත ගිවිසුමකට හෝ එකඟතාවයකට එළඹ නොතිබුණි.

(ii) ඉහත සඳහන් අළුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් 4.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහන් පිළියෙල කර නොතිබුණු අතර 2021 අප්‍රේල් මාසයේදී ආරම්භ කර තිබූ අළුත්වැඩියා කටයුතු මෙම වාර්තාවේ දිනය වනවිටත් නිමකර නොතිබුණි.

(ආ) දහම්පාසල් පොත් මුද්‍රණය

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 3.2 මාර්ගෝපදේශයට පටහැනිව තරඟකාරී ලංසු කැඳවීමෙන් තොරව 2021 වර්ෂයේදී දහම්පාසල් පෙළපොත් හා දහම්පාසල් අයදුම්පත්‍ර මුද්‍රණය කිරීම වෙනුවෙන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත රු.202,725,279 ක් ගෙවීම් කර තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාරිකාරාමය අළුත්වැඩියා කිරීමේදී එහි තිබූ ගෘහ උපකරණ සහ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ දෙපාර්තමේන්තුවේ නිල නිවාස හා වෙනත් අංශ වෙත මාරු කර තිබුණද ඊට අදාල ලිඛිත සනාථ කිරීම් තබා නොගැනීම හේතුවෙන් භාණ්ඩවල ආරක්ෂාව සම්බන්ධ ගැටළු ඇතිවිය හැකි බව නිරීක්ෂණය විය.

(ආ) නො.115, විජේරාම මාවත, කොළඹ 07 හි පිහිටි මහා නායක වාරිකාරාම ගොඩනැඟිල්ල සහිත ඉඩමේ අයිතිය තහවුරු කරගෙන නොතිබූ අතර තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම්ගේ 2019 අප්‍රේල් 01 දිනැති අංක නි.ප්‍රා.ලේ.1/10/2/214 දරන ලිපිය පරිදි 'මහා නායක වාරිකාරාමය පිහිටි භූමිය රජයේ ඉඩමක් බව පෙනී යන හෙයින් ඉදිරියේදී මැණුම්ගත කර අවශ්‍ය කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව' දන්වා ඇතත් ඒ පිළිබඳ බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් පසු විපරම් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

3.4 රජයේ නිලධාරීන් ඇප කැබීම

මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප කැබිය යුතු දෙපාර්තමේන්තු නිලධාරීන් දෙදෙනෙකු විසින් ඇප තබා නොතිබුණි.

4. මානව සම්පත් කළමණාකරනය

දෙපාර්තමේන්තුවේ තනතුරුවල පුරප්පාඩු 100 ක් පැවති අතර ඒ තුළ නියෝජ්‍ය හා සහකාර කොමසාරිස් තනතුරු 03 ක්, බෞද්ධ කටයුතු සමායෝජක තනතුරු 52 ක්, සංවර්ධන සහකාර තනතුරු 22 ක් සහ කළමණාකරන සේවා නිලධාරී තනතුරු 12 ක් විය. එසේ වුවද, එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

එච්.එම්.රණසිංහ බණ්ඩා
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

3.4 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. '000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තෙම්න්තුව		එකතු කරන ලද ආදායම	
		මූල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ (%) ලෙස
නැත.					

3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. '000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන			උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ (%) ලෙස
	මුල්‍ය ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය	තත්‍ය වියදම	
පුනරාවර්තන	1,471,355	1,466,490	1,398,181	95%
ප්‍රාග්ධන	95,009	76,107	68,011	89%

3.6 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතෙයකු ලෙස මෙම දෙපාර්තෙම්න්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. '000

අනු. අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තෙම්න්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
		ප්‍රතිපාදන ලබා දී නොමැත.				

3.7 මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. '000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	නිවස කාර්යාල ගොඩනැගිලි	71,245	71,245	-	100%
9152	යන්ත හා යන්ත්‍රෝපකරණ	82,064	82,064	-	100%
9153	ඉඩම්	8500	8500	-	100%

4. පරිච්ඡේදය
කාර්යසාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස		
	100-90 %	75-89 %	50-74 %
1. නිදහස් දින පිරිත	√	-	-
2. දහම් පාසල් දින උත්සවය	√	-	-
3. සිල් මාතා ආරාම සඳහා පහසුකම් සැලසීම	√	-	-
4. ආදාහන පුජෝත්සවසඳහා වියදම්	√	-	-
5. දහම් පාසල් ගුරුවරු සඳහා නිල ඇඳුම්	√	-	-
6. ත්‍රිපිටකය මුද්‍රණය	-	√	-
7. ශාසනාරක්ෂක මණ්ඩල උපකරණ ලබාදීම	√	-	-
8. දහම් පාසල් පෙළපොත් මුද්‍රණය	√	-	-
9. මිහිදු නිවාස ව්‍යාපෘතිය	-	√	-
10. සිසු නිපුණතා වැසසටහන	√	-	-
11. දහම් සරසවි ඩිප්ලෝමා වැඩසටහන	-	√	-

5. පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයගහණ දර්ශක	මේ දක්වා ජයගහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0-49 (%)	50-74 (%)	75-100 (%)
1. අධ්‍යාත්මික වශයෙන් පරිපූර්ණ දරුවන් බිහි කිරීම.	දහම් පාසල් සඳහා භෞතික පහසුකම් සැපයීම	දහම්පාසල් වල භෞතික යටිතල පහසුකම් වැඩිවීමේ ප්‍රමාණය	-	-	√
2. සාමාජීය,ආර්ථිකමය හා ආධ්‍යාත්මිකවශයෙන් පුර්ණ පුද්ගලයින් බිහි කිරිම.	සාමාජීය,ආර්ථිකමය හා ආධ්‍යාත්මික වශයෙන් පුර්ණ පුද්ගලයින් බිහි කිරිම.	සාමාජීය,ආර්ථිකමය හා ආධ්‍යාත්මිකවශයෙන් පුර්ණ පුද්ගලයින් බිහි වීම			√
3. සාමණේර භික්ෂු පුහුණුව	සාමණේර භික්ෂුන් වහන්සේලා 87 නමක් පුහුණු කිරිම.	ආධ්‍යාත්මිකවශයෙන් පරිපූර්ණ භික්ෂු සමාජයක් බිහි වීම			√
4. බුදුපුත් මා පිය හරසර වැඩසටහන ක්‍රියාත්මක කිරිම.	ශාසනයට තම දරුවන් භාර දුන් දෙමාපියන්ට රාජ්‍ය ගෞරව දැක්වීම	ශාසනයට තම දරුවන් භාර දුන් දෙමාපියන් ඇගයිම ශාසනයට තම දරුවන් භාර දුන් දෙමාපියන් ඇගයිම			√
5. මිහිදු නිවාස ව්‍යාපෘතිය	ශාසනයට තම දරුවන් භාර දුන් නිවාස නොමැති දෙමාපියන්ට නිවසක් ලබාදීම.	ශාසනයට දරුවන් ලබාදුන් දෙමාපියන්ට ලබාදුන් නිවාස සංඛ්‍යාව	√		

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

තිරසර සංවර්ධන ඉලක්ක අතරින් ‘‘තිරසර සංවර්ධනය පිණිස සාමකාමී හා සංයුක්ත සමාජ ප්‍රවර්ධනය උදෙසා සැමට ප්‍රවේශය ලබා දීම සහ ඵලදායී වගවීම සහිත සංයුක්ත ආයතන ගොඩනැගීම’’යන 16 වන සංවර්ධන ඉලක්කය සපුරා ගැනීමට මෙම දෙපාර්තමේන්තුව මගින් සෘජු දායකත්වයක් ලබා දීම සිදු වේ.

ඒ අනුව යමින් ළමා සමාජය ඵලදායී හා විනය ගරුක කිරීම සඳහා බෞද්ධාගමික ඉගැන්වීම් වෙනුවෙන් ඉරිදා දිනයන්හි බෞද්ධ විහාරස්ථාන ආශ්‍රිතව දහම් පාසල් පද්ධතියක් ක්‍රියාත්මක වන අතර දහම් පාසල් යටිතල පහසුකම් සැපයීමට වෙන් වන ප්‍රතිපාදන ප්‍රමාණය සීමා සහිත වීමත්, ස්වේච්ඡා ගුරුවරුන්ගෙන් පමණක් දහම් පාසල් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සිදු වී තිබීමත්, ඉරිදා දින දරුවන් සඳහා වෙනත් උපකාරක පන්ති පැවැත් වීම මත දරුවන් දහම් පාසල් වෙත පැමිණීම දුර්වල වීමත් ළමා සමාජය තුළ දහම් දැනුම වර්ධනය කිරීමට පවතින බාධාවන් වේ.

ජනගහනයෙන් බහුතරයක් බෞද්ධ ජනතාව දිවයින පුරා විසිරී සිටියද දුෂ්කර ප්‍රදේශවල පිහිටි සමහර විහාරස්ථානවල ස්වාමීන් වහන්සේලා නොසිටීම හෝ අල්ප වශයෙන් සිටීමද ජනතාවට ලබා දිය යුතු ශාසනික මෙහෙවර ලබා දීමට බාධාවක් වී ඇත.

එසේ වුවද, පවතින සම්පත් ප්‍රශස්ත මට්ටමින් උපයෝගී කර ගනිමින් 2021 වර්ෂය තුළ නියමිත ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ අතර කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ වුවද ව්‍යාපෘතින්හි භෞතික ප්‍රගතිය ඉහළ ප්‍රතිශතයක් ගැනීමෙන් ඒ බව තහවුරු වේ.

තවද මෙම දෙපාර්තමේන්තුව ලබාගත් ජයග්‍රහණ අතර 2018 වසරට අදාලව රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාවට අනුව ඉහළ කාර්යය සාධනයක් අත්කරගත් ආයතන සඳහා සම්මාන පිරිනැමීමේදී 2020.02.28 දින පාර්ලිමේන්තුවේ පැවති සම්මාන ප්‍රදාන උත්සවයේදී මෙම දෙපාර්තමේන්තුව රන් සම්මානයක් හිමිකර ගැනීමට සමත් විය.

එමෙන්ම 2018 හා 2019 වර්ෂය සඳහා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනය මගින් සංවිධානය කරනු ලැබූ රජය අංශයෙහි හොඳම ගිණුම් වාර්තා කිරීමේ ආයතන අතරට පැමිණීමට ද හැකිවීම ලබාගත් සුවිශේෂි ජයග්‍රහණයකි.

දෙපාර්තමේන්තුව මගින් යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන කළමනාකරණ දත්ත පද්ධතිය කොවිඩ් වසංගත තත්ත්වයට මුහුණ දෙමින් අතිගරු අග්‍රාමාත්‍යතුමගේ ප්‍රධානත්වයෙන් 2021 වසරේ ජනගත කිරීමට හැකිවීම ශාසනික මෙහෙවර වඩා කාර්යෂමව හා ඵලදායීව ඉටු කිරීමට ප්‍රබල ශක්තියත් විය.

සාමණේර හා උපසම්පදා දත්ත පද්ධතිය උපයෝගී කර ගනිමින් දෙපාර්තුමේන්තුවේ ප්‍රාදේශිය කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් සාමණේර හා උපසම්පදා සහතික පිටපත් නිකුත් කිරීමට හැකිවීම.

ලියාපදිංචි කරන ලද උපසම්පදා සහතික (1950 වර්ෂය දක්වා) දත්ත පද්ධතියට ඇතුලත් කිරීම හැකිවිමද 2021 වර්ෂයෙහි ලබා ගත් ශාසනික ජයග්‍රහණයකි.

6. පරිච්ඡේදය
මානව සම්පත් පැතිකඩ

6.1 බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු - 2021.12.31 දිනට

	තනතුරු නාමය	අයත් වන සේවාව	පන්තිය/ ශ්‍රේණිය	වැටුප් කේතය	අනුමත සංඛ්‍යාව	දැනට සිටින කාර්ය මණ්ඩලය	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව	වෙනත් තරුණු
1.	බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්	ශ්‍රී.ලං.ප.සේ	විශේෂ	SL 3-2016	01	01	0		
2.	අතිරේක කොමසාරිස් ජනරාල්	ශ්‍රී.ලං.ප.සේ	විශේෂ	SL 3-2016	01	01	0		
3.	බෞද්ධ කටයුතු කොමසාරිස්	ශ්‍රී.ලං.ප.සේ	I	SL 1-2016	04	04	0		
4.	ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ	I	SL 1-2016	01	01	0		
5.	ප්‍රධාන අභ්‍යන්තර විගණක	ශ්‍රී.ලං.ග.සේ	I	SL 1-2016	01	01	0		
6.	නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්	ශ්‍රී.ලං.ප.සේ	II/ III	SL 1-2016	06	03	03		
7.	ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ	II/ III	SL 1-2016	01	01	0		
8.	නීති නිලධාරී	දෙපාර්තමේන්තුගත	III	SL 1-2016	01	01	0		
9.	ප්‍රධාන කර්තෘ	දෙපාර්තමේන්තුගත		SL 1-2016	01	01	0		•
10	උප කර්තෘ	දෙපාර්තමේන්තුගත		SL 1-2016	01	01	0		
11	නියෝජ්‍ය කර්තෘ/සහකාර කර්තෘ	දෙපාර්තමේන්තුගත		SL 1-2016	02	01	01		•
12	පරිපාලන නිලධාරී	රා.ක.ස.සේ	අධි	MN 7-2016	01	01	0		
13	ව්‍යාපෘති නිලධාරී	ආශ්‍රිත නිලධාරී		MN 4-2016	02	01	01		
14	බෞද්ධ කටයුතු සමායෝජක	ආශ්‍රිත නිලධාරී		MN 4-2016	315	263	52		•
15	සංවර්ධන සහකාර	ආශ්‍රිත නිලධාරී		MN 4-2016	38	16	22		
16	ගිණුම් සහකාර	ආශ්‍රිත නිලධාරී		MN 4-2016	01	0	01		
17	සංවර්ධන නිලධාරී	සං.නි.සේ		MN 4-2016	382	382	0		
18	සහායක නීති නිලධාරී	ආශ්‍රිත නිලධාරී		MN 4-2016	01	01	0		
19	කළමනාකරණ සේවා නිලධාරී	කළ.සේවා.නි.	I/ II/ III	MN 2-2016	51	39	12		
20	රියදුරු	ඒ.රියදුරු සේ.	I/ II/III	PL 3-2016	12	11	1		
21	බංගලා භාරකරු	දෙපාර්තමේන්තුගත		PL 2-2016	01	-	01		
22	කාර්යාල සේවක සේවය	කා.සේ.සේ	I/ II/III	PL 1-2016	20	16	04		
23	ලොරි සහායක	දෙපාර්තමේන්තුගත		PL 1-2016	02	-	02		
24	බංගලා භාරකරු සහායක	දෙපාර්තමේන්තුගත		PL 1-2016	01	01	0		
25	ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක සහායක	දෙපාර්තමේන්තුගත		PL 1-2016	01	01	0		
26	බංගලා භාරකරු සහායක (චාරිකාරාමය)	දෙපාර්තමේන්තුගත		PL 1-2016	01	01	0		
27	කාර්යාල කාර්ය සහායක (මහනුවර)	දෙපාර්තමේන්තුගත		PL 1-2016	01	01	0		
28	මුරකරු (මුලටියන)	දෙපාර්තමේන්තුගත		PL 1-2016	01	01	0		
29	උපස්ථායිකා (මුලටියන)	දෙපාර්තමේන්තුගත		PL 1-2016	01	01	0		
	මුළු එකතුව				852	752	100		

6.2 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	20	16	04
තෘතීක	1	1	-
ද්විතීක	790	702	88
සුළු	41	33	08

6.3 කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපෑම

- ප්‍රධාන කර්තෘ හා නියෝජ්‍ය කර්තෘ/සහකාර කර්තෘ තනතුරු - 03 කොන්ත්‍රාත් පදනම මත අනුමත කර ඇත.
- අංක 24 සිට 29 දක්වා තනතුරු තනතුර දරන්නාට පෞද්ගලික වනසේ අනුමත කර ඇත. එම තනතුර දරන්නාගෙන් පසු අදාළ තනතුර අහෝසි වන ලෙස අනුමත කර ඇත.
- පුරප්පාඩු පවතින බෞ.කටයුතු සාමායෝජක තනතුරු වෙනුවෙන් නව පත්විම් ලබන සංවර්ධන නිළධාරින් බඳවා ගනු ලැබේ.

6.4 කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය

අනු. අංකය	වැඩසටහෙන් නම/ පුහුණු පාඨමාලාවේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩ සටහෙන් ස්වාභාවය	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය (රු.)	විදේශීය (රු.)		
1.	රැකියා විස්තරය සකස් පිළිබඳ පුහුණු වැඩසටහන	සියලු සේවකයන්	දින 01	4,800.00	-	දේශීය	දෙපාර්තමේන්තු නිලධාරින්ට රැකියා විස්තර සකස් කිරීම පිළිබඳ අවබෝධයක් ලබා දීම.
2.	රජයේ ගිණුම් පිළිබඳ පූහුණු වැඩසටහන	එක් සේවකයෙක්	දින 02	16,000.00	-	දේශීය	රජයේ ගිණුම් පිළිබඳ පුහුණුවක් ලබාදීම
3.	මානව සම්පත් කළමනාකරණ උපාධිය	එක් සේවකයෙක්	වර්ෂයක්	100,000.00	-	දේශීය	මානව සම්පත් කළමනාකරණ
4.	රාජ්‍ය කළමනාකරණ පශ්චාත් උපාධිය	එක් සේවකයෙක්	වර්ෂයක්	250,000.00	-	දේශීය	රාජ්‍ය කළමනාකරණය

7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	√		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	√		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්	×	ව්‍යාපාර හා නිෂ්පාදන කාර්යයන් ඉටු නොකරන බැවින්	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	×	ගබඩා අත්තිකාරම් ගිණුම් කටයුතු නොපවතින බැවින්	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	×	විශේෂ අත්තිකාරම් ගිණුම් නොපවතින බැවින්	
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛණ නඩත්තු කිරීම**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	√		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම**			
3.1	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	√		
3.2	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	√		
4	**වාර්ෂික සැලසුම් සකස්කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	√		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම	√		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	√		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	√		
5		**විගණන විමසුම්**		
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	x		
6		**අභ්‍යන්තර විගණනය**		
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	√		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා දී තිබීම	x		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතෙය්දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයා ට ඉදිරිපත්කර සිටීම	√		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශෙයන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	√		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 1-2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ටෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	√		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිලිබඳ තොරතුරු කොම්ප්ටෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කිරීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතෙය්දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	√		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	√		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	√		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	√		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	√		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතෙය්දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.5	2016.06.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	√		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	×		
10	**බැංකුගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත්කර තිබීම	√		
10.2	සමාලෝචිත වර්ෂෙය් දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	√		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	√		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතෙය්දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයන් උපයෝජනය කල පසු වර්ෂ අවසානෙය්දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	√		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	√		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	√		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	√		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධෙයන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	√		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානෙය් දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහයුම් දෙපාර්තෙම්න්තුවට ප්‍රේශණය කර තිබීම	√		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතෙය්දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	√		
14.4	අග්‍රිම ගිණුම් ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	√		
15	**ආදායම් ගිණුම්**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායෙමන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	×	ආදායම් ගිණුම් නොපවතින බැවින්	
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කොට තිබීම	×	අදාළ නොවේ	
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	×	අදාළ නොවේ	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	√		
16.2	කාර්යමණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	√		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල ෙනොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල ෙනොවීම අනාගතෙය්දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / වෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	√		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	√		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2018 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි , පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමෝපදේශයක් සකස්කොට තිබීම	√		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැසමක් සකස් කොට තිබීම	√		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අඩුම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවසථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	√		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛනයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම කරෙගන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	√		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතෙය්දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.4	ඉහත චක්‍රලේඛ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් කියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	√		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	√		